2018 අප්‍රේල්
01 කාණ්ඩය 06 කලාපය
ISSN 25792369
ආධාරය රු:50/-

# FORWARD

සටන් කරන තාරුණ්‍යයට




සැවොම වෙනුවෙන්...
ගනිමු පෙරමුණ...
එක හඬක්...
එකම සටනක්...

රොද බැඳන්
පෙළ ගැහෙමු...
ලොව දකින
අලුත් ඇස්
ප්‍රභාවෙන් එළිය කර
විනිවිදිනට අඳුරු වූ
මේ අධම ලෝකය...




02 විශ්වයේ අසිරිමත් මනස...



04 අලුත් උදෑසනක්...



11 අස්ථාවර සමාජයක...



13 BLACK HOLE



# විශ්වයේ අසිරිමත් මනස

"විශ්වයට සීමාවක් නැහැ. ඒ ආකාරයටම මිනිසුන්ගේ උත්සාහයත් සීමාරහිත විය යුතුයි. තත්වය කෙතරම් අයහපත් වුණත් බලාපොරොත්තු ඉටුකරගන්න කුමක් හෝ මාර්ග යක් තියෙනවා. ජීවිතය ඇති තාක් බලාපොරොත්තුත් පවතිනවා."

විශ්වය කෙතරම් දිගු වේ ද? එතරම් අනන්තයක් අතක දුරින් ගෙනහැර පෑමට හැකි නම් ඒ මනස කෙතරම් විසල් විය යුතුද? අයින්ස්ටයින් ඇතුළු නූතන විද්‍යාඥයින්ගේ සොයාගැනීම් ගණිතමය මෙවලම් මඟින් තහවුරු කරමින්ද, කළු කුහර පිළිබඳ අභිරහස් විසඳමින්ද, මහා පිපුරුම් න්‍යාය පෝෂණය කරමින්ද, නවතම සොයාගැනීම් සිදුකරමින්ද විද්‍යාවේ ප්‍රගමනයට උරදුන් ලොව කීර්තිමත්ම න්‍යායික භෞතික විද්‍යාඥයා වන්නේ ස්ටීවන් හෝකින්ය. අයින්ස්ටයින්ගෙන් පසුව විදුලොව මවිත කළ ඒ අසහාය බුද්ධිමතා සිය ගමනට නැංගුරම්ලූයේ පසුගිය 14 වන දින ලොවපුරා සුවහසක් දෙනාගේ දහසක් හද සෝසුසුම් මැදිනි.

වර්ෂ 1942 ජනවාරි 8 වැනි දින මෙලොව පහන් කළ ස්ටීවන් විලියම් හෝකින් ශාන්ත අල්බින් පාසලෙන් සිය මූලික අධ්‍යාපනය හැදෑරීය. ඔහුව වෛද්‍ය ක්ෂේත්‍රය ඔස්සේ ඉදිරියට රැගෙන යාම ඖෂධ පිළිබඳ ගවේෂකයෙකු වූ ඔහුගේ පියාගේ අපේක්ෂාව වුවද ස්ටීවන් ගණිතය හා භෞතික විද්‍යාවට දැඩි ලෙස ප්‍රිය කළේය. පාසලේදී එතරම් දස්කම් නොදැක්වූ ඔහු සිටියේ පංතියේ අවම ලකුණු ලබාගත් සිසුන් ත්‍රිත්වය අතරේය. එහෙත් වයස අවුරුදු 17 වනවිට ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලයට ඇතුළු වන හෙතෙම භෞතික විද්‍යාව පිළිබඳ පළමු පෙළ ගෞරව උපාධියකට වරම් ලබයි. අවම කාලයක් තුළදී විෂය කරුණු පහසුවෙන් ග්‍රහණය කිරීමට සමත් සුවිශේෂී හැකියාවකින් හෙබි හෝකින් එම විශ්වවිද්‍යාලයේ ඉතා සමාජශීලී චරිතයක් ද විය. පසුව ඔහු තම පශ්චාත් උපාධිය සඳහා කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලයට ඇතුළු විය.

"මරණින් පසු ජීවිතය යනු අඳුරට බිය මිනිසුන් සඳහා වන සුරංගනා කතාවක් බව මම සිතමි."

විශ්වයම කැළඹූ හෝකින් සතු ප්‍රබල මනස රැඳවා තැබුණේ දුර්වල කයක් තුළය. වයස අවුරුදු 21 වනවිටම ඔහු Amyotrophic Lateral Sclerosis(ALS) නම් මාංශ පේශී චලනයට අදාළ සෛල මියයන නැතහොත් මාංශ පේශී ක්‍රමිකව මියයන රෝගයකට ගොදුරු විය. අනතුරුව අවුරුදු දෙකක් වැනි ඉතාම කෙටි කලකින්ම ඔහු මිය යන බවට මත පළකළද එම වෛද්‍ය අනාවැකි පවා නිරුත්තර කරමින් අඩසියවසකට වැඩි කාලයක්ම ඔහු තරු අතර සැරිසරමින් විශ්වයේ සැඟවුණු රහස් අනාවරණය කරගැනීමට උත්සුක විය. එවන් රෝගී තත්වයක් යටතේ මිනිසෙකුට ජීවිතය පිළිබඳව තිබේ යැයි සිහිනයකින් පවා සිතිය නොහැකි ආකාරයේ දැඩි අධිෂ්ඨානයක් හෝකින් සතු විය. එහෙයින්ම ඔහු සිය අමරණීය ගමනේ ඇරඹුම සනිටුහන් කළේද තම මරණ මංචකය අභියසේ සිටය. 1973 දී ස්ටීවන්ගේ පළමු කෘතිය වන The Large Scale Structure එළිදැක්වෙන්නේ අනතුරුවය.

කුතුහලය ඔස්සේ දැනුම සොයා යන ගමනේ දී විටින් විටම ගතින් අබලන් වූ ඔහුට 1970 වනවිට කථන අපහසුතා පවා ඇති විය. 1985 දී නියුමෝනියාව සමඟ සටන් කළ ඔහු යළිත් වරක් මරණයට සරදම් කළේය. එහෙත් සිය ගමන් මගේ වැදගත් සංධිස්ථානයක් වූ A Brief History Of Time ග්‍රන්ථය ඔහු අතින් බිහිවන්නේ ද එවන් පරිසරයක් තුළය.

"දැනුමේ ලොකුම සතුරා නොදැනීම නොව මිථ්‍යාවයි."

හෝකින් ගැඹුරු මූලධර්ම මත පදනම් වූ විශ්වයේ තතු විද්වතුන් අතරට පමණක් සීමා නොකළේය. මිථ්‍යාවන්ගෙන් අඳ කරනු ලබන බාහිර සමාජය තුළටද නොකඩවා ගලා යා යුතු එම දැනුම, සරල බසකින් ග්‍රන්ථකරණයකොට සාමාන්‍ය ජනතාව අතර බෙදාහැරියේ එනිසාය. එවන් දැක්මක් සහිත මේ නිහතමානී මිනිසා බ්‍රිතාන්‍ය මහ රැජිනගෙන් ලද නයිට් පදවිය පවා ප්‍රතික්ෂේප කළේය. හෝකින්ගේ හා ඉතා අසීරු අවස්ථාවලදී පවා ඔහුව අත්නොහැර ඔහුගේ ගමනට දිරිදුන් දයාබර බිරිඳ ජේන්ගේ ජීවිත කතාව අලලා 2014 වසරේදී The Theory Of Everything නමින් චිත්‍රපටයක්ද නිර්මාණය විය.

මෙලෙස වසර 76ක් පුරා සාපේක්ෂතාවාදය හා ක්වොන්ටම් යාන්ත්‍ර විද්‍යාව සිය විෂය පථය කරගනිමින් විශ්වීය දැනුම් සයුරට වරුසාවක් එක්කළ ලොව කීර්තිමත්ම විශ්ව විද්‍යාඥයා වූ ස්ටීවන් විලියම් හෝකින් සදා අප මතකයේ රැඳෙනු ඇත.

## ජාතික සමඟිය වෙනුවෙන් සත්‍යග්‍රහයක්



පසුගිය කාලය තුළ ඇති වූ ජාතිවාදී ගැටුම් හා ජාතිවාදය පැතිරවීමට එරෙහිව මාර්තු 09 දා සත්‍යග්‍රහයක් පැවැත්විණි. ඒ විහාරමහා දේවි උද්‍යානය ඉදිරිපිටදීය. ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධානත්වයෙන් පැවති මෙම සත්‍යග්‍රහය සඳහා සිවිල් සංවිධාන නියෝජිතයින්, කලාකරුවන්, විශ්වවිද්‍යාල ආචාර්යවරුන්, ජාතික භික්ෂු පෙරමුණේ භික්ෂූන්වහන්සේලා හා මුස්ලිම් සංවිධාන නියෝජිතයින් ඇතුළු විශාල පිරිසක් සහභාගී වූහ.

එහිදී අදහස් දක්වමින් අපේ රටේ සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර්, මැලේ යන සියලු ජන කොට්ඨාසයන්ගේ සම අයිතිය පිළිගැනීමකින් තොරව ජාතික සමඟිය ගොඩනැගීමට නොහැකි බව ජනතා විමුක්ති පෙරමුණේ නායක අනුර දිසානායක සහෝදරයා ප්‍රකාශ කළේය.

## ලෝක ගුරු සමුළුවේ උප සභාපති ධූරය මහින්ද ජයසිංහට



ඉකුත් 04 හා 05 දෙදින තුළ මෙක්සිකෝවේ පැවති ජාත්‍යන්තර ගුරු සංගම් සමුළුවට ශ්‍රී ලංකාව නියෝජනය කරමින් සහභාගී වූ ලංකා ගුරු සේවා සංගමයේ ප්‍රධාන ලේකම් මහින්ද ජයසිංහ සහෝදරයා ආසියානු කලාපය නියෝජනය කරමින් එහි උප සභාපති ධූරයට පත්ව ඇත.

ජාත්‍යන්තර ගුරු සමුළුවේ ඉදිරි වසර හතර සඳහා මෙම පත්වීම අදාළ වන අතර රටවල් 40කට අධික සංඛ්‍යාවක් වෙනුවෙන් ගුරු සංගම් 156 ක නියෝජිතයින් සමුළුවට සහභාගී වූහ.

## පොහොර සහනාධාර අරගලය ජයගනී



ගොවීන් අඛණ්ඩව ගෙනගිය අරගලයක ප්‍රතිඵලයක් ලෙස යළිත් පෙර පරිදිම පොහොර සහනාධාරය ලබාදීමට රජය තීරණය කර ඇති බව වාර්තා වේ. පසුගිය 13 වන දා දඹුල්ලේ දී පැවති මාධ්‍ය හමුවක් අතරතුරදී මේ පිළිබඳව අදහස් දක්වමින් සමස්ත ලංකා ගොවිජන සම්මේලනයේ ජාතික සංවිධායක නාමල් කරුණාරත්න සහෝදරයා ප්‍රකාශ කර සිටියේ ගොවීන්ට තම අඛණ්ඩ අරගලයේ ප්‍රතිඵල ලැබී තිබෙන බවයි. එසේම කෘෂිකර්මාන්තයට අදාළව විශාල නිෂ්පාදන පිරිවැයක් දැරීමට සිදුවීම හේතුවෙන් ඉදිරියේදී ගොවීන්ට මෙම පොහොර නොමිලේ ලබාදීමට කටයුතු කරන්නේ නම් එය ඉතා ප්‍රශංසනීය බවද හෙතෙම සඳහන් කළේය.

## විධායක ජනපති ගෙදර යවන 20 වැනි සංශෝධනය ජවිපෙන්



මේ මොහොතේ රට තුළ පවතින දේශපාලන ව්‍යාකූලත්වය උපයෝගී කොට ගනිමින් විධායක ජනාධිපති ධූරය අහෝසි කිරීම සඳහා වූ 20 වන ව්‍යවස්ථා සංශෝධනය පාර්ලිමේන්තුවට ගෙන ඒමට ජනතා විමුක්ති පෙරමුණ මූලිකත්වය ගන්නා බව පැවසේ.

මේ පිළිබඳ වැඩිදුරටත් අදහස් දක්වමින් පක්ෂ නායක අනුර දිසානායක සහෝදරයා ප්‍රකාශ කර සිටියේ මීට ඉහතදී ද අපේ රටේ දේශපාලනයේ විශේෂ ව්‍යාකූල තත්වයන් මතු වූ බොහෝ අවස්ථාවල දී ජනතාවට විවිධ ජයග්‍රහණ ලබා ගැනීමට හැකියාව ලැබුණු බවයි. ඒ අනුව 2001 වසරේ දී චන්ද්‍රිකා කුමාරතුංග ආණ්ඩුව සමයේ දී 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයත් 2015 වර්ෂයේ දී එක්සත් ජාතික පක්ෂ අග්‍රාමාත්‍යවරයාත් ශ්‍රී.ල.නි.ප. ජනාධිපතිවරයාත් නියෝජනය කළ සුළුතර ආණ්ඩුව සමයේ 19 වැනි සංශෝධනයත් ඊට උදාහරණ සපයන බවයි. ඔහු මේ අදහස් පළ කළේ පසුගිය 19 වෙනි දින පැලවත්ත, බත්තරමුල්ල හි පිහිටි ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන කාර්යාලයේ පැවති මාධ්‍ය හමුවක් අතරතුරදීය.

## ජාතිවාදයට එරෙහිව "අපි මිනිස්සු"



වෙනසක ඇරඹුම සංවිධානය මඟින් පසුගිය මාර්තු 21 දින "අපි මිනිස්සු" ජාතික සමගි කතිකාව කොළඹ මහජන පුස්තකාල ශ්‍රවණාගාරයේදී පැවැත්විය. රටේ මතු වී තිබෙන ජාතිවාදී ප්‍රවණතා හේතුකොටගෙන ජාතික සමගිය ගොඩනැගීමේ අරමුණින් මෙය සූදානම් කර තිබුණි. මේ සඳහා ජනතා විමුක්ති පෙරමුණේ නායකයන්, පූජ්‍ය පක්ෂය, විශ්වවිද්‍යාල ආචාර්යවරු හා මහාචාර්යවරු, සිවිල් සංවිධාන නියෝජිතයින්, විද්වතුන්, කලාකරුවන් ආදී විශාල පිරිසක් සහභාගී වූහ. මෙහිදී දේශන හා ජාතික සමගි ගී ප්‍රසංගයක්ද පැවැත්විණි.

# උතුරේ දාන්න බැහැ කියපු රතු කොඩිය අපි දාලා පෙන්නුවා



*ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම කමිටු සාමාජික රාමලිංගම් චන්ද්‍රසේකරන් සහෝදරයා සමඟ කළ කථාබහක් ඇසුරෙනි.*

## රාම් අයියේ, කොහොමද පක්ෂයට සම්බන්ධ වෙන්න කලින් ජීවිතේ?

හ්ම්... ඇත්තටම කිව්වොත් පක්ෂයට සම්බන්ධ වෙන්න කලින් අනෙකුත් තරුණයන්ගේ වගේම අපේ ජීවිතත් ඔහේ ගලාගෙන ගියා. නමුත් 1978 වගේ කාලෙදි බණ්ඩාරවෙල, හපුතලේ, ආදී ප්‍රදේශවල ඇති වුණු යම් යම් ජාතිවාදී සිදුවීම් නිසා මමත්, මගේ පවුලත් ඇතුළු විශාල ජනතාවක් පීඩාවට පත්වෙලයි හිටියේ. ඒ නිසාම අපි තරුණයෝ විදියට එකතු වෙලා දෙමළ ජනතාව වෙනුවෙන් යමක් කරන්න හිතුවා. සාකච්ඡා කළා. නමුත් පසුව තේරුණා දෙමළ ජනතාවට විතරක් විමුක්තිය ලබාදෙන්න බැහැ කියලා.

## එතකොට කොහොමද පක්ෂයට සම්බන්ධ වුණේ?

මං කලිනුත් කිව්වා වගේ ජාතිවාදය නිසා අපි බොහෝම පීඩාවට පත්වෙලයි හිටියේ. ඒ කාලෙදි දෙමළ තරුණයා තුළ පොදු හැඟීමක් ඇති වෙලා තිබුණා, දෙමළ ජනතාව වෙනුවෙන් යමක් කළ යුතුයි කියලා. ඉතිං ඔය අතරෙදි අපට පක්ෂයට සම්බන්ධ සහෝදරයෙක් මුණගැහුණා. ඔහු අපි වොලිබෝල් ගහලා එනකම් රෑ වෙනකනුත් බලාගෙන ඉන්නවා, අපිත් එක්ක කථා කරන්න. ඉතින් අවසානයේ දී ඔහු අපිට තදින්ම ඒත්තු ගැන්වූවා, හැමෝටම හිනාවෙන්න පුළුවන් රටක් හදලා මිසක් දෙමළ ජනතාවට වෙනම හිනාවෙන්න ඉඩක් නැහැ කියලා. ඔහු තමයි අපිට ඉගැන්වූවේ ජාතිවාදය වෙනුවට සමාජවාදය තුළයි උත්තර තියෙන්නේ කියලා. අපිට ඔහුගේ තර්කත් එක්ක හැරෙන්නවත් බැහැ. කොහොම වුනත් අවසානයේ දී අපි පක්ෂය ගැනත්, විජේවීර සහෝදරයා ගැනත් හොයන්න උනන්දු වුණා.

## අමතක නොවෙන සිදුවීම් එහෙමත් ඇති ඔය කාලෙ?

ඔව්! ගොඩක් තියෙනවා. එකක් කියන්නම්. මේක සිද්ධ වුනෙත් මම පක්ෂයට සම්බන්ධ වෙන මුල්ම කාලෙදි. පොදවැස්සක් ඇදහැළුණු දවසක, රැස්වීමක් අමතන්න විජේවීර සහෝදරයා එන්න හිටියා. ඒත් හදිසි වැඩසටහනකට යන්න වුණු නිසා ඔහු වෙනුවට ඇවිත් කථාකළේ ඒ කාලේ තරුණ සංගමේ වැඩකරපු යසරත්න කියලා සහෝදරයෙක්. ඒ වෙලාවෙදී මට මතකයි සීතලට ගුලිවෙලා, වකුටු ගැහිලා හිටපු අපි ඉබේටම වගේ හිටපු තැන්වලින් නැගී සිටියා. ඒ තරමටම ඒ කථාව ජවසම්පන්නයි.

## 80 දශකයේ අගභාගයේ දී පක්ෂයට එරෙහිව මර්දනය ක්‍රියාත්මක වෙනකොට බය හිතුණෙ නැද්ද?

මම පක්ෂයට පූර්ණකාලීනව එකතු වෙන්නෙත් 87 අවුරුද්දේ මාර්තු මාසේ 04 වෙනිදා. ඊට දවස් 03කට පස්සේ පොලිස් අත්අඩංගුවට පත්වෙනවා. හිරේදීත් අපි හිටියේ බොහොම විශ්වාසයෙන්. පක්ෂයේ වැඩ කරපු එක ගැන අභිමානයෙන් සමාජවාදය ගැන විශ්වාසයෙන්.

අනෙක 87 කියන්නේ පක්ෂයට දරුණුම කාලයක්. ඒ කාලෙදි පක්ෂයට පූර්ණකාලිනව එනවා කියන්නෙම මරණය තෝරගත්තා වගේ අභියෝගයක්. ඇත්තටම බයට වඩා අපේ හිත්වල තිබුණේ මේ සමාජය වෙනස් කරන්න තිබ්බ නොනිම් ආශාවයි.

## හොඳයි, රාම් අයියේ.... උතුරේ දේශපාලනය පටන් ගැනීමමත් අභියෝගයක් වෙන්න ඇති නේද?

ඇත්තටම බොහොම දුෂ්කරතා මධ්‍යයේ තමයි අපි පක්ෂය ලෙස උතුරේ දේශපාලනය ආරම්භ කළේ. ඒ වගේම 83 පක්ෂ තහනමෙන් පස්සේ අපි නැවත උතුරේ වැඩ පටන් ගත්තේ 2010 දීයි. අපි උද්ඝෝෂණ කළා, අතුරුදහන් වූවන් ගැන සොයාබැලුවා, ජනතාවගේ ජීවිතත් සමඟ බද්ධ වී වැඩ කළා. ඒ කාලය කියන්නේ ඉතා දුෂ්කරතා මධ්‍යයේ වැඩකළ කාලයක්. පසුව 2015 දී තමයි පක්ෂය වඩාත් හොඳින්ම උතුරුකරය තුළ වැඩ ආරම්භ කරන්නේ. ඉතින් එදා ඉඳන් අද වෙනකොට මේ අවුරුදු 03ට අපි විශාල ජයක් ලබා තිබෙනවා. අපට තිබුණට සාපේක්ෂව අද අපිට සහයෝගය දක්වන, ආශිර්වාද කරන, අපිත් එක්ක හිතවත් විශාල ජනතාවක් ඉන්නවා.

> **උතුරේ දේශපාලඥයෝ මොනවා කිව්වත් උතුරේ මිනිහට තියෙන්නේ ඒ දේවල් නෙවෙයි. ඔවුන් විශාල ආර්ථික හා සමාජීය වියවුලකයි ඉන්නේ.**

## කොහොමද උතුරේ මේ පාර මැතිවරණ ප්‍රතිඵලය.

ගොඩක් දුෂ්කරතා මැද යාපනය නගර සභාව ඇතුළු ආයතන 04 කට අපි පක්ෂය ලෙස තරඟ කළා. උතුර තුළ පදනමක් තිබෙන සමහර ප්‍රධාන දේශපාලන කණ්ඩායම්වලට පවා යාපනය තුළ ලිස්ට් හදන්න බැරි මොහොතක අපි අපේක්ෂකයෝ දාලා තරඟ කළා. මහමැතිවරණයේ දී යාපනය, කිලිනොච්චිය දෙකේම අපට ඡන්ද තිබුණේ 257යි. අද ඒක 1000ක් වෙලා. කලින් මුළු උතුරු පළාතෙම තිබුණේ ඡන්ද 400යි. නමුත් අද 3000 කට අධිකයි. ඒ වගේම වව්නියාව තුළ අපට මන්ත්‍රීධූර දෙකක් පවා හිමි වී තිබෙනවා.

## ඡන්ද ප්‍රතිඵලයත් එක්ක ජනතා ප්‍රතිචාර කොහොමද?

උතුරේ ජනතාව අවුරුදු 30ක යුද්ධයකට මුහුණ දීලා ඉන්නේ. ඒ තුළ ඔවුන් විසින්ම හදාගත් මතවාදයක් තිබුණා. ඔවුන්ගේ වටේ ගොඩනගපු දේශපාලනයක් තිබුණා. බොහෝ දේශපාලකයින් තමන්ගේ දේශපාලනය කළේ ජාතිවාදය පදනම් කරගෙනයි. උතුරේ මිනිස්සුන්ව දකුණත් සමඟ වෙන් කරලයි තිබුණේ. ඉතින් එවැනි වටපිටාවක එයින් මිදිලා වෙනත් කෝණයකින් බලන්න පුළුවන් මිනිස්සු උතුරේ හිටියේ අඩුවෙන්. ඒ නිසා එවැනි තත්වයක් තුළ JVP එක උතුරේ මේ තරම් කාලයක් මෙහෙම හිටපු එකත් ලොකු දෙයක් කියලයි ඔවුන් කියන්නේ.

උතුර තුළ ආයෙත් දාන්න බැහැ කියපු රතු කොඩිය අපි දාලා පෙන්නුවා. ඉතින් හරි පැහැදිලියි, අපට උතුරේ වැඩ කරන්න අවකාශයක් තිබෙනවා. වමටත්, ප්‍රගතිශීලී දේශපාලනයටත්, ජනතා විමුක්ති පෙරමුණටත් සැලකිය යුතු ඉඩක් ලැබී තිබෙනවා.

## උතුරේ ජනතාව ගෙවන ජීවිතය කොහොමද?

උතුරේ දේශපාලඥයෝ මොනවා කිව්වත් උතුරේ මිනිහට තියෙන්නේ ඒ දේවල් නෙවෙයි. ඔවුන් විශාල ආර්ථික හා සමාජීය වියවුලකයි ඉන්නේ. යාපනය දිස්ත්‍රික්ය තුළ පමණක් කාන්තාවන්ගේ මූලිකත්වයෙන් යුතු පවුල් 26000ක් තිබෙනවා. උතුර-නැගෙනහිර දෙකේම වැන්දඹුවන් 85,000කට වැඩියි. ඒ වගේම මේ පළාත් දෙකේම දෙමව්පියන් අහිමි දරුවෝ 28,000 ක් ඉන්නවා. ඒ විතරකුත් නෙවෙයි. ඒ ජනතාවගෙන් 40% ක් ම තාම ජීවත් වෙන්නේ කූඩාරම්වලයි. ණය ගෙවාගන්න බැරුව බොහෝ අය දිවිනසා ගන්නවා. රැකියා විරහිතභාවය, මත්ද්‍රව්‍ය උවදුර, ළමා අපචාර ඉහළ අගයක් ගන්නවා. කොටින්ම කිව්වොත් ඉතාමත් දුප්පත් සමාජයක්. ජාතික ආදායමේ උතුරේ පංගුව 1.3% යි. මොකද කිසිම ආර්ථික උත්පාදනයක් නැහැ. සංවර්ධනයක් නැහැ. ඒ නිසා මේක ඉතාමත් ඉක්මනින් විසඳිය යුතු බරපතල ප්‍රශ්න රැසක් තිබෙන භූමියක් බවට පත්වෙලා.

## උතුරේ ජනතාව තුළ පක්ෂය ගැන තිබෙන පොදු හැඟීම මොනවගේද?

තිබුණට සාපේක්ෂව ඉතාම හොඳ තත්වයක් දැන් නිර්මාණය වී තිබෙනවා. විශේෂයෙන්ම ගත්තම යාපනය වගේ තැන්වල වැඩිපුර පක්ෂය හා සම්බන්ධ වී සිටින්නේ තරුණ උදවියයි. ලේසි නැහැ. නමුත් වෙහෙස වී වැඩ කිරීම තුළ අපට ඔවුන්ව දිනාගන්න හැකි වී තිබෙනවා.

ඒ වගේම විශ්වවිද්‍යාලවල ආචාර්ය මහචාර්යවරු, මාධ්‍යවේදීන් හා බුද්ධිමතුන් ආදී බොහෝදෙනෙක් දැන් JVP එක ගැන කථාවෙනවා. විශේෂයෙන්ම තරුණ පිරිස අතර වඩාත් ප්‍රගතිශීලී දේශපාලන සංවාදයක් ඇති වෙනවා නම් ඒ JVP කාර්යාලයක් ඇතුළෙයි කියලයි. ඔවුන් කියන්නේ. ඉතින් ජාතිවාදී දේශපාලනය හා 30 අවුරුදු යුද්ධයක් විසින් ගිනිතියපු ජනතාවක් ඉන්න තැනක් වුනත් ඒ සමාජය තවමත් කුරුවල් වෙලා නැහැ. ඒ නිසා පක්ෂය ලෙස අප හැමවිටම උත්සාහ කරනවා ඒ ජනතාවත් සමඟ එකතු වී ඔවුන්ගේ විශ්වාසය, ආදරය තව තවත් දිනාගැනීමට. යහපත් සමාජයක් නිර්මාණය කරන අපේ ගමනට ඔවුන්වත් දායක කරගන්න.

# අලුත් උදෑසනක් වෙනුවෙන්

සිදුවීම් සිදුවන්නේ හඬා වැළපීමටවත් කොක් හඬලා සිනාසීමටවත් නොවේය. පාඩම් ඉගෙනීමටය. මෙහිද බොහෝ සිදුවීම් සිදුවන්නේය. මෙහි යනු ලංකාවේය. අතිසුන්දර, රමණීය ලංකාවේය.

ගෝත්‍රවාදී මුග්ධ වියරු ජාතිවාදය නැවත වටයකින් හිස ඔසවමින් තිබෙන්නේය. ඒ නිසාම සිංහල, දෙමළ හා මුස්ලිම් ඇතුළු රටේ සියලු ජනතාවගේ ආරක්ෂාව පිළිබඳව සැකසංකා මතුවෙමින් තිබෙන්නේය. පහුගිය කාලය පුරාම මෙවැනි සිදුවීම් සිදුවෙමින් යටයමින් නැවත නැවත් සිදුවූයේය. බොහෝ ඈත ඉතිහාසයේ සිට මේ දක්වාම මෙවැනි සිදුවීම් තම දේශපාලන අතකොළු බවට පත්කර ගැනීමට සියලු පාලකයන් කටයුතු කළ බවත් මේ මොහොතේදීද සිදුකරමින් සිටින බවත් අප සැම වඩාත් හොඳින් තේරුම් ගතයුතුව ඇත්තේය.

1977දී හයෙන් පහක බලයක් ලබාගනිමින් මහමැතිවරණයෙන් ජය ලැබූ ජේ.ආර් ගේ බල උද්දාමය විසින් ලාංකීය ජන සමාජය උඩුයටිකුරු කර දැම්මේය. මිනීමැරීම් හා පළිගැනීම් අවසානයේ සිංහල හා දෙමළ ජාතිකත්වයන් අතර වෛරය වපුරවන ලද ලංකා ඉතිහාසයේ අඳුරුතම කාලපරිච්ඡේදයක් නිර්මාණය කළේය. වසර 30ක් පුරා මිනිස් ජීවිත ද දේපළ ද දස දහස් ගණනින් ගිනිබත් කළ ජාතිවාදී යුද්ධයක් ඇවිලී ගියේය.

ජාතිවාදය පැනනගින්නේ හුදෙකලා හෝ ඕපපාතික සිදුවීම් ලෙස නොවේය. ජාතිවාදය මත පදනම් වූ බල උවමනාවක් සහිත දේශපාලනයක් ක්‍රියාත්මක වෙමින් තිබෙන්නේය. ඒ නිසා මෙය ඕපපාතික ලෙස එක් මිනිසෙකුගේ ඔළුවේ මතුවන මනස්ගාතයක්ම පමණක් නොවන්නේය. අදත් එය පැහැදිලි දේශපාලන උවමනාවන් වෙනුවෙන් දියත් කරමින් තිබේ.



ජාතිවාදය පදනම් කරගත් මේ දේශපාලනය අපේ රටේ බිම් මට්ටමේ පවා ක්‍රියාත්මක වෙමින් තිබේ. විටෙක උඩට එමින් ද තවත් විටෙක යට යමින් ද උත්සන්න වෙමින් ද යටපත් වෙමින් ද මේ ජාතිවාදී දේශපාලනය වර්ධනය වන්නේය. එසේම එය අතිශය විනාශකාරී හා විසකුරු ලෙස පැතිරෙමින් හා වර්ධනය වෙමින් ද තිබෙන්නේය.

2014 අලුත්ගම හා බේරුවල සිද්ධීන්, 2017 ගිංතොට සිදුවීම, 2018 අම්පාරේ ඇතිවූ සිදුවීම මෙන්ම පසුගිය දිනවල ඇති වූ දිගන හා තෙල්දෙණිය සිද්ධීන් පිළිබඳව අප හදවතින් පමණක් නොව මනා අවබෝධයකින් ද විමසා බැලිය යුතු වන්නේ ඒ නිසාය. මේ සිද්ධීන් කිසිවක් ක්ෂණික කෝපයෙන් පමණක් හටගත් දේ නොවන්නේය. එය කිසියම් අහඹු සිදුවීමකට සැලසුම්සහගත ජාතිවාදී නඩ මැදිහත් වෙමින් ඉතාමත් සංවිධානාත්මකව, රාජ්‍ය පාලකයින්ගේ ආශිර්වාදය හා ආරක්ෂාව යටතේ ක්‍රියාත්මක කෙරුණ උසිගැන්වීමය.

එනිසා අප මෙහි සැඟවී තිබෙන දේශපාලනය කවරක්දැයි තේරුම් ගැනීම අතිශය වැදගත්ය. බලයේ ඉන්න අය තමන්ගේ පැවැත්ම වෙනුවෙන් ජාතිවාදය උපයෝගී කරගනී. එසේම බලය අහිමි වූවන් තමන්ගේ බල න්‍යාය පත්‍රය අත්පත් කරගැනීම වෙනුවෙන් වූ බල ව්‍යාපෘති ජාතිවාදය හරහා දියත් කරමින් තිබේ. ආණ්ඩුව තමන්ගේ බලය පවත්වා ගැනීම වෙනුවෙන් හිතාමතාම ජාතිවාදය ව්‍යාප්ත වීමට ඉඩදී තිබේ. එසේ නැතිනම් එවන්නක් නොදැක්කා සේ අහක බලා සිටින්නේය.

මෙතෙක් පැවති කිසිඳු ආණ්ඩුවක් රටේ පොදු ජනතාවගේ මූලික අවශ්‍යතාවයන් පවා ඉටු කිරීමට සමත් වී නැත්තේය. ඒ නිසාම පොදුජන ප්‍රශ්න යටපත් කරගැනීමේ උපක්‍රම පාලකයන්ට අවශ්‍යය. ඒ සඳහා භාවිතා කළ හැකි ප්‍රබලම අවියකි ජාතිවාදය. එය මෙරට පාලකයින් බොහෝ කාලයක් තිස්සේ අත්හදා බලන ලද අත්බෙහෙතකි. එසේම ජනතා ප්‍රශ්න විසඳීමේ දැක්මක් හෝ වැඩපිළිවෙළක් නොමැති බංකොලොත් දේශපාලන පක්ෂ විසින්ද එක් එක් ජනකොටස් රවටා ගැනීමටත් ඔවුන්ගේ ඡන්ද ලබාගෙන බලයට පත්වීමටත් ජාතිවාදය යොදා ගනී. සෑම ජාතිකත්වයක් තුළම සිටින ජාතිවාදී කණ්ඩායම් පෝෂණය වන්නේ අනෙක් ජාතිවාදයන් ක්‍රියාත්මක වන පමණටය. එක් ජාතිවාදයක් විසින් තවත් ජාතිවාදයක් පෝෂණය කරන්නේය. එය ජාතිවාදයේ ජාති ලක්ෂණයි. ඒ නිසා මෙම වෛරයේ ගිනිදැල් නිවා දැමිය යුතුම වන්නේය.

අපගේ සැබෑ අරගලය ඇත්තේ කොහිද, කාට එරෙහිවදැයි අප තේරුම්ගත යුත්තේය. ඒ නිසා වරක් දෙවරක් නොව සියවරක් වුව සිතා සිහිනුවණින් කල්පනා කොට බැලිය යුත්තේය. වසර ගණන් වගා නොකළ බිම් වගා කර සිංහල, දෙමළ, මුස්ලිම් සියලු ජනයාගේ අස්වනු නෙළීමට දැන් කාලය එළැඹ තිබේ. එහෙත් ඒ අස්වනු මිලදී ගැනීමක් ගැන කතා නැත. ඒ විතරක් නොව, රැකියා විරහිත උපාධිධාරීන් විශාල ප්‍රමාණයක් ද රට තුළ සිටී. සිංහල, දෙමළ, මුස්ලිම් තරුණ තරුණියන් සියල්ලෝම පවා ඒ අතර ද සිටී. රටේ ජනතාවගේ සෞඛ්‍ය විශාල අනාරක්ෂිතභාවයකට ද පත්ව තිබේ. සිංහල, දෙමළ, මුස්ලිම් කවුරුත් එයට මුහුණ දේ. එහෙයින්ම පොදු ජනයාගේ අයිතිවාසිකම් සුරැකීමේ විශාල සටනක් අප ඉදිරියේ තිබේ. එය සිංහල, දෙමළ, මුස්ලිම් ජනතාව සාමූහිකව එකතු වී කළයුතු අරගලයකි. එසේම එය අවිශ්වාසය, වෛරය, ක්‍රෝධය වපුරමින් මිනිසාගේ ජීවත් වීමේ අයිතිය පවා උදුරා ගන්නා මේ සමාජ ක්‍රමයට එරෙහි සටනකි. එබැවින් සැබෑ අරගලය ඇත්තේ මේ ධනපති ක්‍රමයත් එය රැකගැනීමේ මෙහෙයුමේ නිරතව සිටින අධම පාලකයන්ටත් එරෙහිව බව අප පමා වී හෝ තේරුම් ගතයුතුමය. එසේ තේරුම් ගැනීමත් අවබෝධයෙන් ක්‍රියා කිරීමත් විසින් තව දුරටත් අඳුරු අනාගතයක් හිමිකර ගැනීමෙන් වළකාලමින් සිනහවේ ළහිරු කැන් වැටී ඒකාලෝක වූ අලුත් උදෑසනක් වෙත අපව කැඳවාලනු ඇත.

## bookiයෙන්














FORWARD
සමාජවාදී තරුණ සංගමයේ මධ්‍යම පුවත්පත
464/20, පන්නිපිටිය පාර,
පැලවත්ත, බත්තරමුල්ල.
Tel: 0112193721
Email: syuforwardnews@gmail.com
syulanka@gmail.com
fb:syulanka
web:syulanka.com

# අලුත් අවුරුද්දේ අලුත් වෙමු!...

මීට දශක දෙකකට විතර කලින් නම් දලු, මල්, ගෙඩිවලින් පිරිලා අලුත් වෙන වටපිටාව වගේම දසත පැතිරෙන කොවුල් නාදය තමයි, ළඟ එන සිංහල හා හින්දු අලුත් අවුරුද්ද ගැන අපට ඉඟි පෑවෙ. ඒත් දැන් තත්වය ඊට වඩා හුඟාක් වෙනස්. අවුරුද්දට මාස ගණනකට කලින් ඉඳලම තමයි මීඩියාවලින් අවුරුදු අරන් එන්නේ. නානාප්‍රකාර දේ ගැන විවිධ දැන්වීම් පළ කරලා, එක එක සේල් ගැන ප්‍රචාරය කරනවා. ඉතින් වුවමනාවක් ඇතිව හෝ නැතිවම ඒවා දැකලා අහලම මොනවම හරි අවුරුද්දට ගන්න, කරන්න අපටත් හිතෙනවා. ඇත්තට බැලුවොත් ඒක නෙවෙයිද දැන් සිද්ධ වෙන්නේ?

තරුණ, වැඩිහිටි භේදයකින් තොරව, සල්ලිහාගෙ වැඩිපුර ඇති අය වැඩිපුරත්, නැති අය තමන්ට පුළුවන් ප්‍රමාණයටත්, අවුරුද්දට අලුතින් දේවල් අරගන්නවා. අවුරුදු හින්දම කොච්චර අමාරුකම් මැද්දෙ වුනත් අපි ගේදොර අස්පස් කරලා, හුණු, තීන්ත ගාලා, ඉන්න තැන අලුත් කරගන්නවා. අඩුමතරමේ ගේදොර අස්පස් කරලා, නැකතට කිරි උතුරවලා අලුත් අවුරුද්දෙ වැඩ පටන් ගන්නවා.

මේ තමයි කාලයක ඉඳලා අලුත් අවුරුද්දක් ආවහම අපි කරපු දේ, හැබැයි... අපි නොකරපු දෙයකුත් තියෙනවා. ඒ තමයි අපි කොහොමද ඇත්තටම අලුත් වෙන්නෙ කියලා නොහිතපු එක. ඒ තමයි හැමදාම කිරීමට අවශ්‍යම වුණු දේ, ඒත් අපි අතින් අතහැරුණෙත් ඒකමයි. අපි කාලයක් තිස්සේම අලුත් වෙන්න කියලා හිතාගෙන කෙරුවෙ අපේ අවට පරිසරයේ තියෙන දේ අලුත් කරගත්ත එක විතරයි. ඒත් එතැනින් එහාට ගිහින් අපි තුළ තියෙන චින්තනය එහෙමත් නැත්නම් දැක්ම අලුත් කරගන්න අපි උත්සාහ ගත්තෙ නෑ.

ඒ හින්දා හැමදාමත් සිද්ධ වුණේ, අවුරුදු කාලෙදි හදාපු කැවුම් කොකිස් පරණ වෙලා යනවා වගේ අපිත් පරණ වෙලා යන එකයි. අවුරුදු නිවාඩුව පටන් ගනිද්දි අපිව පෙරවගත්තු සතුටත් අවුරුදු නිවාඩුව ගෙවෙනවත් එක්කම නැතිවෙලා යනවා. ආයෙමත් පරණ අවුරුද්දෙ වගේම උදේ සිට රෑ වන තුරුත් රැයේ සිට එළිවෙන තුරුත් වැඩ කරන කර්කශ තැනකට අපේ ජීවිත පත්වෙනවා. මේක නොවෙයිද අපි අත්දකින සැබෑව.

එහෙනම් අලුත් අවුරුද්දට ලෑස්ති වෙලා ගේ දොර අලුත් කරලා අලුතින් බඩු මුට්ටු අරගෙන ගේ ඇතුළට ගියාට වැඩක් වෙන්නෙ නෑ, පරණ මිනිස්සුම නම් ආපහු ඒ ගේ ඇතුළට යන්නේ. ඒ හින්දම තරුණ ඔබට වගකීමක් තියෙනවා, මේ සිංහල හා හින්දු අලුත් අවුරුද්දෙ අලුත් කෙනෙක් වෙන්න, අලුත් විදියට හිතන කෙනෙක් වෙන්න. ඔබට අලුත් වෙන්න අලුත් පාරක් පෙන්වන්න අපි සූදානම්! එන්න, FORWARD අපිත් එක්ක අලුත් වෙමු!

## මාර්තු 05

දිනය ආරම්භයේදීම පෙරදා සිදුවූ ජාතිවාදී ගැටුම්වලට අදාළ විවිධ රූපරාමුවලින් බුකිය පිරීයමින් පැවතිණ. ජාතිවාදය හා අන්තවාදය විසින් සමාජයක් විනාශය වෙත ඇද දමා ඇත්තේ කෙලෙසද යන්න ඒ තුළින් හොඳින්ම පසක් කොට ඇත්තේය. රටක් ලෙස ගත් කල ජීවිත මෙන්ම මහා දේපළ විනාශයක් ද සිදුකරමින් අවසන් වූ 30 අවුරුදු යුද්ධයක් අවසන තවමත් ලේ සොයනා මුග්ධයින් සිටීම කෙතරම් ඛේදවාචකයක්ද? ඔවුනොවුන් ලේ හලාගත්තේ නැවත වතාවක් අපේ රට ම්ලේච්ඡ යුගයක් කරා ඇද දැමීමට විනා සිංහල හෝ වේවා දෙමළ හෝ වේවා මුස්ලිම් හෝ වේවා පොදුජන යහපත පතානම් නොවේමය. එහෙයින්ම මේකී ඛේදවාචකයෙන් රටට මෙන්ම සමාජයටද සිදුකළ හානිය බරපතලය. එයින් රිදුණේ මිනිස්කමටය.

එසේම ධනපති දේශපාලන පක්ෂ විසින් ප්‍රසිද්ධියේ මෙන්ම අප්‍රසිද්ධියේ ද මෙකී ජාතිවාදී ගැටුමට අනුග්‍රහය සැපයීමට කටයුතු කළේය. එසේ නොවන්නට මෙය මෙතරම් ඔඩුදුවන්නේ නැත. කෙසේවුවද මෛත්‍රී - රනිල් හවුල් ආණ්ඩුව ලැබූ මැතිවරණ පරාජය හමුවේ මුහුණ දෙමින් සිටි දේශපාලන අර්බුදයන් තාවකාලිකව සමනය කරගැනීමත්, ඒකාබද්ධ විපක්ෂය විසින් තමන්ට ඡන්දය ලබාදුන් ජනතාව වෙත ලබා දී තිබූ මහින්ද අගමැති කරවීමේ බොරු පොරොන්දුව යටපත් කිරීමටත්, අග්‍රාමාත්‍යවරයාව විශ්වාසභංගයකින් ගෙදර යැවීමත් යන දේශපාලන පොරොන්දු සියල්ලම ක්ෂණිකව යටපත් කරගැනීමට එමඟින් හැකි විය. එබැවින් මෙකී සිදුවීම ලංකාවේ ධනපති දේශපාලන කණ්ඩායම් සියල්ලම තම අර්බුද වසාගැනීමට ලද ආශිර්වාදයක් කර ගත්තේය.

## මාර්තු 20



### ළමයින්ට ළමයින් සේ සලකමු

ඒඩ්ස් වැළඳුණු මවකගේ දරුවා පාසලට ඇතුළත් කර නොගත් විදුහල්පතිවරයෙකුගේ ක්‍රියාකලාපය සම්බන්ධයෙන් රටේ විශේෂ කතාබහක් ඇතිවිය. FB පිටු අතර ද එම පාසල් දැරිය විසින් ජනාධිපතිවරයා වෙත යැවූ ලිපියක් හුවමාරු වනු දක්නට විය. ඒ හරහා එම දැරිය මුහුණ පාන දැඩි අපහසුතාවය හා අකටයුතුකම් පිළිබඳව කියැවිණි. තම මව පෙළෙන රෝගී තත්වය හේතුකොට ගෙන තම පාසලේ විදුහල්පතිවරයා හා ගුරුවරුන් විසින් තමන් වෙත සිදුකරනු ලබන කෙනෙහෙලිකම් එහි ලියා දැක්විණි.

අප රටේ ගුරුවරුන් යැයි කියා ගන්නා ඇතැම් අයගේ සැබෑ ස්වරූපය මෙයයි. ඉඳින් ගුරුවරුන් දෙවිවරුන් සේ සලකන්නේ ළමයින් ළමයින් ලෙස සලකා කටයුතු කිරීමේ අප්‍රමාණ සෙනෙහසක් ඇති උත්තම ගණයේ මනුෂ්‍යයන් ඉදිරියේ මිස මෙවන් යමපල්ලන් ඉදිරියේ නොවන බව කිව යුතුමය.

## මාර්තු 23

### මෙන්න ඩීල්

FB පිටු අතර වඩා වේගයෙන් සැරිසරන්නට වූයේ ගාල්ල මහනගර සභාවේ බලය ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ හිමි කරගත් බවයි. අද දවස තුළ පමණක් බලය පිහිටවූ සභා ගණනාවකම වැඩිම සහිත ධූර සංඛ්‍යාවක් ලබා සිටි කණ්ඩායම් අභිබවා වෙනත් කණ්ඩායම් විසින් සභාපති ධූර ලබාගත් අවස්ථා ගණනාවක්ම වාර්තා වුණා. මැතිවරණ වේදිකාවේ වෙන්ව එකිනෙකාට චෝදනා එල්ල කර ගත්තද ප්‍රතිපත්ති හා ක්‍රියාකාරීත්වයේදී තමන් එකම කණ්ඩායමක් බව තහවුරු කරමින් වෙනසකින් තොරව එජාපයද, ශ්‍රීලනිපය ද මහින්දගේ පොහොට්ටු කණ්ඩායමද එක්ව බලය පිහිටවූහ. ''ඩීල් දමනවා'' යැයි කියමින් ජව්පෙට බොරු අවලාද නගන මේ ධනපති කණ්ඩායම් තුළ ඇති සැබෑ ඩීල් මොනවාද යන්න එළිපිටම හෙළිදරව් වෙමින් පවතී.

## මාර්තු 24

### කැම්පස් අරින්නෙ කවදාද?

රටේම කැම්පස් වැහිලා දැනට මාසෙකට ආසන්නයි. නමුත් බොහෝ මාධ්‍යයවල මේ ගැන අවධානයක් යොමුකර නෑ. අපේ රටේ උසස්



අධ්‍යාපනයේ කේන්ද්‍රස්ථානය වෙච්ච විශ්වවිද්‍යාල පද්ධතිය පාලකයින්ගෙ වැරදි නිසා මාසයක්ම වැහිලත් ඒ ගැන කතාබහක් රට තුළ නැති එක කණගාටුවට කරුණක්.

රටක් ලෙස සලකන විට උසස් අධ්‍යාපනය කියන්නේ තීරණාත්මක දෙයක්. ඒත් මේ සිස්ටම් එකට උගත්තු බිහිකරන එක අත්‍යාවශ්‍ය නෑ. ඒ හින්ද රටේ පාලකයින්ට ඒ ගැන වගේවගක් නෑ. නමුත් රටේ අනාගතයත් සමාජයත් ගැන හිතන මිනිස්සු හැටියට අනධ්‍යන සේවකයින්ගේ ප්‍රශ්නවලට විසඳුම් දීලා මේ ප්‍රශ්නය විසඳන්න කියලා ආණ්ඩුවට බලකර සිටීම අප කාගේත් වගකීමක් නොවේද?

## මාර්තු 25




### සම්මානයට ඇති ඡන්දයට නැති ක්‍රම විරෝධය

ලාංකීය ප්‍රේක්ෂකයා වෙත නවමු ටෙලිනාට්‍ය අත්දැකීමක් එක්කළ කුඹියෝ හි ජෙහාන්ගේ චරිතයට පණ පෙවූ තුමිඳු දොඩම්තැන්න ගැනයි බුකිය පුරාම තැන තැන කථාව. ඒ ඔහු රයිගම් ටෙලි සම්මාන උළෙලේ ජනප්‍රියම නළුවාට හිමි සම්මානය හිමිකර ගැනීමෙන් අනතුරුව කළ ප්‍රකාශයක් නිසායි. "මේ සම්මානය විසින් පෙන්නන්නේ මේ ජරාජීර්ණ වුණු ගොඩගන්න බැරි සිස්ටම් එක පිළිබඳව ප්‍රේක්ෂක ප්‍රජාව කළ තිබෙන විරෝධය" කියලයි තුමිඳු කියලා තිබුණේ. කොහොම වුණත් මේ ගැන පළවුණු එක් පෝස්ට් එකක් සඳහා තරුණයින් දාලා තිබුණු කොමෙන්ට් වලින් මේ ගැන අලුතින් හිතන්න ඕනා කියලා ඉඟි කරලා තිබුණා.

ලිංගිකත්වය පිළිබඳව 06 කොටස

# සිපගැනීමෙන් AIDS බෝ වෙයිද?



වෛද්‍ය ශාන්ත හෙට්ටිආරච්චි



### වෛද්‍යතුමනි, ආසාදනයේ විවිධ අවධි ඇති බව අප අසා තිබෙනවා. ඒ මොනවාද?

1. ප්‍රාථමික අවස්ථාව (primary HIV infection)

2. ප්‍රතිශක්තිය අඩුවීමේ ආරම්භක අවධිය (Early infection depletion)

3. ප්‍රතිශක්තිය අඩුවීමේ අතරමැදි අවධිය (Intermediate immune depletion)

4. ප්‍රතිශක්තිය විශාල ලෙස අඩුවීමේ අවධිය (Advanced Immune depletion)

### වෛද්‍යතුමනි, ප්‍රාථමික අවධියෙහි ඇතිවිය හැකි රෝග ලක්ෂණ මොනවාද?

වෛරසය ශරීරගත වී සති 2-4 අතර කාලයකින් පසුව එළැඹෙන්නේ HIV ප්‍රාථමික අවස්ථාවයි. එහිදී හිසරදය, උණ, ශාරීරික වේදනා, සමෙහි දද, කැස්ස, වසා ගැටිති ඉදිමීම හෙවත් කුද්දට් ඇති වීම, කෑම අරුචිය, වමනය හා පාචනය වැනි රෝග ලක්ෂණයන් මතු වේ. තවත් සති 2-3 ක කාලයක් ඇතුළත මෙම රෝග ලක්ෂණ ඉවත්ව යාම සාමාන්‍ය ස්වභාවයයි.

### ඉන්පසුව එළඹෙන ප්‍රතිශක්තිය අඩුවී යාමේ අවස්ථා ගැන කතා කරමු. ඒවායේ දී මතුවිය හැකි රෝග ලක්ෂණ මොනවාද?

HIV ආසාදනයේ දෙවන අවස්ථාව වන්නේ, ප්‍රතිශක්තිය අඩුවීමේ ආරම්භක අවධියයි. එහිදී සිදුවන්නේ යහපත් සෞඛ්‍ය තත්වයක් පවතින අතරතුරේදී සුළු අසනීප තත්වයන් විටින් විට මතුවීමයි. සිරුරෙහි විවිධ ස්ථානවල වසාගැටිති මතුවීමද මෙහිදී ඇතිවිය හැකියි.

ඉන් අනතුරුව එළඹෙන්නේ ප්‍රතිශක්තිය අඩුවීමේ අතරමැදි අවධියයි. සිරුරෙහි ප්‍රතිශක්තිය සැලකිය යුතු ප්‍රමාණයකින් අඩුවී යාම නිසා විවිධ රෝගකාරක ආසාදනයන්ට ලක්වීම එහිදී සිදුවනු ඇත. උණ, සිරුරෙහි බර අඩුවීම, සමෙහි ඇතිවන විවිධ ආසාදන හෝ කැපෝසි සාකෝමා (Caposi Sarcoma) නම් පිළිකා තත්වයන්, මුඛයෙහි ඇතිවන දිලීර හා වෛරස් ආසාදන, ලිංගේන්ද්‍රිය ආශ්‍රිතව හටගන්නා විවිධ ආසාදන තත්ව එහිදී දැකගත හැකියි.

### ප්‍රතිශක්තිය විශාල ලෙස අඩුවීම හෙවත් Advanced Immune Depletion "ඒඩ්ස්" නමින් හඳුන්වනවා. මෙය පැහැදිලි කර දෙන්න.

මෙය HIV ආසාදනයේ අවසාන අවධියයි. විවිධ රෝගකාරකයන්ට (වෙනත් වෛරස, බැක්ටීරියා, දිලීර රෝග ආදී) පහසුවෙන් ලක්වීම සිදුවේ. පහත සඳහන් වන්නේ එහිදී දැකිය හැකි රෝගී තත්වයන්ය.

1.සිරුරේ බර විශාල ලෙස අඩුවීම

2. මසකට වැඩි කාලයක් පැවතිය හැකි උණ, පාචනය

3. පෙණහලු මෙන්ම සිරුරේ වෙනත් අවයව, පද්ධතීන්වල (වකුගඩු, වසා ගැටිති, ආහාර මාර්ග පද්ධතිය ආදී) මතුවන ක්ෂය රෝගය. (Tuberculosis) මෙහිදී උණ, දහඩිය දැමීම, ආහාර අරුචිය, ඇඟපත වේදනා, කැස්ස, කැස්ස සමඟ ලේ පිටවීම ආදිය ඇති විය හැක.

4. අසාමාන්‍ය නියුමෝනියා රෝගී තත්වයන්

5. අන්නශ්‍රෝතය, ගලනාලය දක්වා පැතිරුණු කැන්ඩිඩා දිලීර ආසාදනය

6. මධ්‍ය ස්නායු පද්ධතියේ විවිධ ආසාදන

7. කලකට ඉහතදී ශරීරගත වූ පැපොල වෛරසය නැවත ක්‍රියාකාරී වීමෙන් ඇතැම් ස්ථානවල හට ගන්නා හර්පීස් සොස්ටර් (Herpes zoster) නම් ආසාදන තත්වයන්

HIV/AIDS යනු සුවකළ නොහැකි මාරාන්තික රෝගයක් ලෙසට වූ මතයක් සමාජයේ පැතිර පවතී. මෙයට ඖෂධ ප්‍රතිකාර තිබේද/නැතිද, එසේනම් ඒවා ලබාගන්නේ කෙසේද යනාදී මෙම ගැටලු සියල්ල නිරාකරණය කර ගැනීමට ඉදිරි Forward කලාපය තෙක් රැඳී සිටින්න...

සටහන: වෛද්‍ය රිසිනි විල්මා

ලිංගික රෝග පිළිබඳව ඔබට ඇති ප්‍රශ්න, ගැටලු අපට යොමු කරන්න.

Forward පුවත්පත, 464/20, පන්නිපිටිය පාර, පැලවත්ත, බත්තරමුල්ල.

**නිවැරදි කිරීමයි**

පසුගිය කලාපයේ මෙම ලිපියේ පළවූ "2017 වසර අවසන් වන විට මෙතෙක් ලංකාව තුළ වාර්තා වූ ඒඩ්ස් ආසාදිතයින්ගේ ප්‍රමාණය 2841කි." යන්න පහත පරිදි නිවැරදි විය යුතුය. 2017 වසර අවසාන වන විට මෙතෙක් ශ්‍රී ලංකාව තුළ වාර්තාගත වූ HIV ආසාදිතයින්ගේ සංඛ්‍යාව 2841. ඉන් 707 දෙනෙකු AIDS රෝගී තත්වයට පත්ව ඇත.

## ඔබේ පැනයට පිළිතුරු:

Forward පුවත්පත කියවන තරුණ ඔබට HIV සහ AIDS පිළිබඳ යම් යම් ගැටලු මතු වී ඇති බව පසුගිය කාලය තුළ අප වෙත යොමු වූ ප්‍රශ්නවලින් පැහැදිලි වේ. ඉතින් ඔබේ ගැටලුවලටත් ඉඩක් වෙන්කිරීමට අප කල්පනා කළා.

**01. HIV ආසාදිතයකු විසින් නිරෝගී පුද්ගලයෙක් සිපවැළඳ ගනිද්දී එම ආසාදනය බෝ වෙනවාද? එසේම පොදු පහසුකම් පරිහරණය කිරීමේදී ද එම ආසාදන වැළඳෙනවාද? (ශමී - හලාවතින්)**

*HIV වෛරසය බහුල වශයෙන් පවතින්නේ HIV ආසාදිතයකුගේ ලිංගික තරලයේ සහ රුධිරයේයි. ඒ හැර ආසාදිත මවකගේ මව්කිරිවලද සුළු වශයෙන් පැවතිය හැකියි. නමුත් ආසාදනයක් සිදුවිය හැකි ප්‍රමාණයකින් ඛේටය තුළ වෛරසය නොපවතින නිසා සිපවැළඳ ගැනීමකදී (තොල් ස්පර්ශ කිරීමෙන්) ආසාදනය වීමේ ඉඩකඩක් නැහැ. වෛරසය බාහිර පරිසරයට නිරාවරණය වීමක දී ක්ෂණිකව විනාශ වන්නේ, මිනිස් සිරුරෙන් බැහැරව එහි ජීවී ස්වභාවයත් පැවතිය නොහැකි නිසායි. ඒ නිසා ස්පර්ශයෙන්, පොදු පහසුකම් පරිහරණයෙන් හෝ වෙනත් සමීප ඇසුරකින් HIV ආසාදනය වීමේ කිසිදු හැකියාවක් නැහැ.*

**02. මදුරුවන් දෂ්ට කිරීමෙන් HIV ආසාදනය වේද? (සුනෙත් - රත්නපුර)**


*නැහැ. මදුරුවන් ඇතුළු වෙනත් සතුන්ගේ ශරීරවල මෙම වෛරසය ජීවී ස්වභාවයෙන් පවතින්නේ නැහැ. ඒ නිසා මදුරුවන් මඟින් HIV පැතිරීමට ඉඩක් නැහැ.*

*03. HIV සහ AIDS යනු එකක්ද?* **දෙකක්ද? (තුෂාරි - අම්පාර )**

*වෛරසය සිරුරට ඇතුළු වූ පුද්ගලයකු හැඳින්වෙන්නේ HIV ආසාදිතයකු ලෙසයි. HIV ආසාදනයේ අවසාන ප්‍රතිඵලය වන්නේ AIDS (ඒඩ්ස්) රෝගී තත්වයයි. ආසාදිතයාගේ සිරුරේ ප්‍රතිශක්තිය හෙවත් වෙනත් රෝගවලට ඔරොත්තු දීමේ හැකියාව ක්‍රමයෙන් අඩුවීම අනුව "ඒඩ්ස්" තත්වයට ළඟාවීම සිදුවේ. පුද්ගලයකුගේ සිරුරෙහි ප්‍රතිශක්තිය පවත්වා ගැනීමේ කාර්යයේදී රුධිර වසා සෛල (Lymphocytes) අත්‍යවශ්‍යයි.*

*HIV ආසාදිතයකුගේ රුධිරයේ වසා සෛල ක්‍රමයෙන් විනාශයට පත්වන්නේ ඒ තුළ වෛරසය වර්ධනය වීමට අනුවයි. HIV ආසාදිතයකු AIDS රෝගියෙකු බවට පත්වීමට ගතවන කාලය සාමාන්‍යයෙන් වසර 8-10ත් අතර විය හැකියි. නමුත් පුද්ගලයාගෙන් පුද්ගලයාට අදාළ කාල පරාසයන් වෙනස් වීමේ සම්භාවිතාවක් ද ඇත.*

# හැඩ මවන හාදු The Shape Of Water



"මම කවුද? මම මගේ කට හොලවනවා. හරියට ඔහු වගේ. මට කටහඬක් නෑ. හරියට ඔහුට වගේ. ඒ තමයි මම! ඔහු දන්නේ නැහැ මගේ අඩුපාඩුව. එහෙමත් නැත්නම් ඔහු දන්නේ නැහැ මම කොහොමද අසම්පූර්ණ වෙන්නේ කියලා... ඔහු මාව දකින්නේ මම විදියට. හරියට මම මාව දකිනවා වගේ..."

ජලය මිහිපිට ජීවයයි. ජලයෙන් තොරවූ මිහිමඬලක් ගැන කෙසේ සිතන්නද? නමුදු ජලයට කිසිඳු පැහැයක්, ගන්ධයක් හෝ හැඩයක් නොවෙයි. එය මෙබඳු යැයි විස්තර කළ හැකි වේ නම් ඒ තවකෙකුට සාපේක්ෂව පමණි. වැළඳගන්නේ කෙසේ ද, ඇය එහි හැඩයට අනුරූපව එහි ලැගුම්ගනී. ප්‍රේමයද එසේමැයි! The Shape Of Water මේ ප්‍රේමයේ කතාවයි.

2018 ඔස්කාර් සම්මාන උලෙළහි වසරේ හොඳම චිත්‍රපටය, හොඳම චිත්‍රපට අධ්‍යක්ෂණය, හොඳම සංගීත නිර්මාණය හා හොඳම නිෂ්පාදන සැලසුම්කරණය සඳහා වන ඔස්කාර් සම්මාන හතරකින් පිදුම් ලැබූ මෙම සිනමා සිත්තම Guillermo del Toroගේ අධ්‍යක්ෂණයක් වන අතර නිෂ්පාදනය del Toro හා J. Miles Dale විසිනි. 2017 වසරේ වැනීසියානු ජාත්‍යන්තර සිනමා උලෙළහිදීද හොඳම චිත්‍රපටය ලෙස Golden Lion සම්මානය දිනාගැනීමට සමත් වූ මෙම සලරුව තවත් සිනමා උලෙළ ගණනාවකදීද හොඳම අධ්‍යක්ෂණය, හොඳම තිරරචනය, ඇතුළු ක්ෂේත්‍ර රැසක් වෙනුවෙන් සම්මාන 20ට අධික ප්‍රමාණයක් දිනාගත් හොලිවුඩයේ විශිෂ්ටතම නිර්මාණයකි.

ඇමෙරිකාවේ බැල්ටිමෝර්හි අධිආරක්ෂාවක් යටතේ පවත්වාගෙන යනු ලබන රජයේ පර්යේෂණාගාරයට 1962 එක්තරා දිනයක් ඉතා සුවිශේෂී විය. ඒ මෙතෙක් ඔවුන්ගේ ඇසට හසු නොවූ, බාහිර පරිසරයට අතිශය ලෙස බැඳුණු අමුතුමාකාරයේ ජීවියෙකු එහි රැගෙන ඒමත් සමඟය. ස්ට්‍රික්ලන්ඩ් නම් ආරක්ෂක නිලධාරියා යටතේ මෙම නවමු මෙහෙයුම දියත් කළමුත් දෙපයින් සිට නැගෙන මිනිසෙකු වන් එහෙත් මිනිසෙකු නොවන මෙම කොරළ සහිත සත්වයා තුළ ජීවයක් දැකීම පවා හෙතෙම අප්‍රිය කළේය. සත්වයා අබිමුව දියත් වන ඔහුගේ යමපාලනය අධි වෝල්ටීයතා යෂ්ටියකින් දෘෂ්‍යමාන වුවත් ඊට එහා ගිය අදෘෂ්‍යමාන විරසකයක් ඔහු තුළ ගැබ්ව පැවතියේය.

"ඔබතුමාට උවමනා කරලා තියෙන්නේ සෝවියට් දේශයට කලින් අපේ රටෙන් අභ්‍යවකාශයට මිනිහෙක් යවන්න. මනුෂ්‍ය ශරීරයට ඔරොත්තු නොදෙන තත්ව දරාගන්න මෙම සත්වයාට පුළුවන්."

"ඔයාලා දන්නවද එයාලා බැල්ලක්ව අභ්‍යවකාශයට යවලා අපිව හිනැස්සුවා. ඊට පස්සේ කොමියුනිස්ට්කාරයෙක්වත් යවයි. රුසියන්කාරයෝ අපේ ග්‍රහලෝකෙ වටේ කරක් ගහනවා. ඊළඟට මොනවා වෙයිද කියලා දෙවියෝ තමයි දන්නේ. අපිත් මොනවහරි ඉගෙනගන්න එපැයි!..."

වරෙක ස්වදේශික ජනයාගේ ඇදහීමට පවා පාත්‍ර වූ දකුණු ඇමෙරිකානු ගං තීරයෙන් මෙබිමට ගොඩබට මෙම උභයජීවියාගේ ඉරණම ඇමෙරිකානු රජය විසින් ඒ වන විටත් ලියා අවසන්ව තිබිණ.

"ඔහු සතුටුයි මාව දකින්න, හැමවෙලාවෙම, හැමදවසකම... දැන් මට එක්කෝ ඔහුව බේරගන්න පුළුවන්.. නැත්නම් ඔහුට මැරෙන්න ඉඩදෙන්න පුළුවන්."

Sally Howkings ගේ අතිශය සියුම් භාව ප්‍රකාශනයන්ගෙන් හදවත් ස්පර්ශ කරන, ආදරයේ සැබෑ ස්වරය ලොවට පබඳින ඈ නමින් එලයිසාය. පර්යේෂණාගාරයේ පිරිසිදු කිරීමේ



සේවිකාවක ලෙස සේවයේ නිරත ඇය අපමණ රැකවල් මධ්‍යයේ වුවද ඒ නාඳුනන ජීවියා සමඟින් මනුෂ්‍යත්වය බෙදාගනිමින් ඔහුගේ සමීපතමයා බවට පත්වී සිටියාය. මිනිස් සමාජය තුළ හුදෙකලාව සිටි ඇය දැන් ඔහු තුළින් ඇගේ ඡායාව දකින්නීය. පෙනි පෙනී මරණයට නියම වන ඔහුව සුරැකීම විනා එලයිසා වෙන කුමන මඟක් නම් තෝරාගනීද?

සීතල යුද්ධයකට මැදි වූ පර්යේෂණාගාරය තුළ ඇමෙරිකානු රජයේ අණසක පරිදි සත්වයාගේ අවසන් කටයුතු ඇරඹීමට නියම වී තිබුණේ විද්‍යාඥ හොෆ්ස්ටේට්ලර්ටය. මරණය තබා එම සත්වයාට සිදුකළ හිංසාවලට පවා එරෙහි වූ හෙතෙම ඒ වනවිටත් රුසියානු කණ්ඩායමක් සමඟ සත්වයා බේරාගැනීම සඳහා රහසිගත මෙහෙයුමක නිරතව සිටියේය. එලයිසාගේ සටනේ හවුල්කරුවෙකු වීමට ඔහුට හැකිවන්නේ ඒ අනුවය.

ඔහු හා තවත් සගයන් දෙදෙනෙකුගේද සහය ඇතිව එලයිසා සිය සටනට මුලපුරන්නීය. මනුෂ්‍යත්වයේ මානයකුදු නොවූ එවන් පරිසරයක් තුළ ප්‍රේමයේ නිර්ව්‍යාජ සුවඳ තැවරූ එලයිසා ඇගේ සටන කෙලෙස ජයගනියි ද? හැඩයක් නොමැති ජලය තුළ ප්‍රේමයේ හැඩ මවන The Shape Of Water ඔවුන්ගේ කතාවයි.

## සරදියෙල්ගේ කොලම

රුපියල් 2500යෙන් පවුලක් ජීවත් වෙන හැටි කියලා දුන්නු බන්දුල ගුණවර්ධන මහත්තයා පොහොට්ටුව දිනපු හැටිත් හරි අපූරුවට කියලා දුන්නා. ඒකෙන් මේකෙන් පොහොට්ටුවෙන් දිනපු සෙට් එක නිකම්ම පොල්ලෙලි වෙලා ගියා. ඒ වගේ පොල්ලෙල්ලෙක් එයාගෙ චණ්ඩි නෝනා එක්ක බත්තරමුල්ල පැත්තෙ show එකක් පෙන්නලා තිබුණා. අපේ කොල්ලෙක් බය නැතුව ඒක video කරලා මාධ්‍යවලටත් දීලා තිබුණා.

පිස්තෝලයකුත් උස්සගෙන නෝනා, මහත්තයාට full sup එක දුන්නේ driver මල්ලිට ගහන්න. තාත්තා ගිය පාරෙ නොගියොත් ඒකා නොට්ටිගෙ පුතා වෙනවනේ. Driver මල්ලිට ගහලා ගහලා නෝනාටයි මහත්තයාටයි හති අරින්න වුණේ ආණ්ඩුවේ බෝඩිමේ. උසාවියේදී පොල්ලෙල්ල කතාකරලා කියනවා bus driver තව 20ක් එක්ක විතර වටකරලා පොල්ලෙල්ලට තැළුවලු. ඒකලු ආත්මාරක්ෂාවට ප්‍රියම්භිකාවත් එක්ක එකතුවෙලා driver මල්ලිට බිම දාගෙන තැළුවේ. පොල්ලෙල්ලෙක් කට ඇරියොත් ඉතින් ගොං කතාවක් තමයි.

මොනවා වුණත් හොඳ වෙලාවට ඒ පොල්ලෙල්ලා සිංහල බෞද්ධයෙක් වුණේ. නැත්තං. ඉතින් සාමාන්‍ය පෙළ විභාගයෙනුත් බුද්ධාගම අසමත් වුණ බෞද්ධ යැයි කියාගන්නා මෝඩ රැළ බත්තරමුල්ලෙත් කඩ ගිනි තියනවා sure.! ඒත් ඉතින් මේ පොල්ලෙල්ලාත් මහා රජාගේ නියෝජිතයෙක්නේ. ඒ නිසා මොනවා කළත් අවුලක් නෑ.

ඒකාබද්ධ පොල්ලෙලි වළේ අයිතිකාරයා ඡන්දෙන් පස්සේ අගමැති වෙනවයි කියලා දැන් විරුද්ධ පක්ෂේ නායකකම හිඟා කනවා. යුද්ධෙ දිනාගෙන එද්දි මෙහාට රිංගපු ඇමෙරිකන් ගෝඨා 20යි 20 ජනාධිපති හීනෙ දකිනවා. හමුදා මූලස්ථානෙ විකුණපු ලෝකෙ එකම ආරක්ෂක ලේකම් මේකා කියලා අපේ රටේ බයියොන්ට තේරෙන්නෙ නෑ. ජනාධිපති වෙන්න සිහින මැව්වට මෙයා උසාවියට පණ බයයි. කරලා තියෙන පව්වල තරම තමයි. ඒ අස්සෙ සිංහල හා හින්දු අලුත් අවුරුදු මාසෙ ඉඳන් අපේ රට විරුවන්ගෙනුත් අලුත් බද්දක් ගහන්න තීන්දු කරලා තියෙන්නේ. සරදියෙල්ගේ පරපුරේ කොල්ලො කෙල්ලන්ට කියන්නේ, මෙච්චර මේ විදේශ විනිමයක් ගේන උඹලාවත් හූරන් කන්න එනව නම්, ගුවන්තොටේදීම ඇදලා ඇරපන් පොලු පාරක්. අකුලගෙනම යන්න.!

නූතන සරදියෙල්



# නීති විරෝධී ඉන්දියානු බීජ සමුළුව

ඉන්දියාවේ ජාතික බීජ සංගමය (National Seed Association Of India) මඟින් සංවිධානය කරන ඉන්දියානු බීජ සමුළුව (Indian Seed Congress) මෙරට කිසිදු රාජ්‍ය ආයතනයක හෝ ගොවි සංවිධානයක මැදිහත් වීමකින් තොරව 2018 පෙබරවාරි මස 05 හා 06 දෙදින තුළ ශ්‍රී ලංකාවේ දී පැවැත්විණි. දීර්ඝ කෘෂිකර්ම ඉතිහාසයකට උරුමකම් කියන අප රට තුළ "බීජ" වැනි ඉතා සංවේදී අත්‍යවශ්‍ය ක්ෂේත්‍රයක සමුළුවක් මෙරට කිසිදු බලයලත්, නිල ආතනයක මැදිහත් වීමකින් තොරව පැවැත්වීම පිළිබඳ අපගේ විරෝධතාවය ප්‍රකාශ කර සිටිමු.

බීජ නිරෝධායක අනුමැතිය ලබා නොගෙන මෙම සමුළුව සඳහා ඉන්දියානු බීජ සමාගම් ගණනාවක් විසින් ලංකාවට බීජ වර්ග ගෙන ඒමට කටයුතු කර තිබේ. මේ මඟින් ලංකාවේ බෝග ප්‍රභේදවලට රෝග පැතිරවීමේ අවදානමක් ද ඇති විය හැකි අතර ලංකාවේ බීජ නිෂ්පාදන වෙළඳපොළ ඉන්දියානු සමාගම් යටතට අත්පත් කර ගැනිමට උත්සාහ ගනිමින් සිටී. ඇමරිකාව, නෙදර්ලන්තය, තායිලන්තය, පකිස්තානය, ජර්මනිය, ජපානය හා මැලේසියාව වැනි රටවල සමාගම් බහුතරයක් විසින් මෙරට බීජ නිෂ්පාදන අයිතිය අත්පත් කර ගෙන සිටින අතර ඉන්දියාවේ බීජ නිෂ්පාදන සමාගම් ගණනාවක් විසින් ගුණාත්මක බවින් තොර බීජ හා වල් පැළෑටි බීජ සහිත අර්තාපල් හා ළූණු බොහොමයක් නීති විරෝධී ලෙස ලංකාවට ගෙන ඒම සිදු කරයි.

ඉන්දියානු සමාගම් විසින් ශාක ආරක්ෂණ පනත උල්ලංඝණය කරමින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කිසිඳු අනුමැතියකින් තොරව එම බීජ ගෙන එන අතර දේශපාලන බලය හා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සමහර නිලධාරීන් සම්බන්ධ කරගෙන රේගු දෙපාර්තමේන්තුවෙන් මෙම බීජ වර්ග වෙළඳපොළට යොමු කිරීම සඳහා නිදහස් කර ගනී.

ඒ මඟින් මේ වන විටත් ලංකාවේ බීජ නිෂ්පාදකයින් දැඩි අසීරුතාවයකට පත්ව සිටින අතර ගුණාත්මක බවින් තොර මෙන්ම රෝගකාරක හා වල් පැළෑටි බහුල බීජ වර්ග ගෙන්වීම හේතුවෙන් ගොවි ජනතාව ද දැඩි අසීරුතාවයකට පත්ව සිටී. එවන් තත්වයක් තුළ මේ සමුළුව මඟින් තවදුරටත් උත්සාහ දරන්නේ බීජ අයිතිය මෙරට ගොවි ජනතාවට අහිමි කර බීජ ආනයන ක්‍රියාවලියේ කොටස්කරුවන් බවට ඉන්දියානු සමාගම් පත් කර ගැනීමයි.

මේ සමුළුව සඳහා ගෙන එනු ලැබූ බීජ වර්ග සඳහා කිසිඳු නිරෝධායන සහතිකයක් හෝ ලබා ගෙන නොමැත. නිරෝධායනය නොකළ බීජ ලංකාවට ගෙන ඒම නීති විරෝධී ක්‍රියාවක් වන අතර ශාක ආරක්ෂණ පනතේ 10 (2) උප වගන්තියට අනුව එවන් වරදකට මහේස්ත්‍රාත් අධිකරණයක් ඉදිරියේ වරදකරුවකු වන පුද්ගලයෙකු මාසයත්, මාස හයත් අතර කාලයකට බන්ධනාගාර ගත කිරීමට හෝ රුපියල් දස දහසත්, ලක්ෂයත් අතර දඩයකට යටත් කිරීමට හෝ මෙම දඬුවම් දෙකටම හෝ යටත් කළ හැකි ය.

කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතියකින් තොරව මෙලෙස බීජ ලංකාවට ගෙන ඒමේ හැකියාවක් නොමැත. නමුත් මෙම සමුළුව පිළිබඳව කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හෝ කෘෂිකර්ම අමාත්‍යංශයට හෝ නිසි අවබෝධයක් නොමැති බවක් පෙනේ.

එහෙත් ඉන්දියානු බීජ සමාගම් විසින් ඉතාම සූක්ෂමව ලංකාවේ බීජ වෙළඳපොළ අත්පත් කර ගැනීමට නීති විරෝධී උත්සාහයක් ගනිමින් සිටින බව තහවුරු වී තිබේ. ඉන්දියානු සාමසාධක හමුදාව ලංකාව තුළ රැඳී සිටි කාලයේ දී නිසි නිරෝධායන ක්‍රමවේදවලින් තොරව මෙරටට එළවන් ගෙන්වා ඇත. එහිදී එම සතුන් සමඟ පාතීනියම් ශාකයේ බීජ මෙරටට පැමිණීමේ ප්‍රතිඵලයක් ලෙස අද වනවිට වියළි කලාපයේ බොහෝ ප්‍රදේශවල පාතීනියම් ශාකය දරුණු ආක්‍රමණිකයකු ලෙස පැතිරීම සිදු වී ඇත.

පසුගිය දා ලංකාවට හොර රහසේ ඉන්දියාවෙන් ගෙන එන ලද අර්තාපල් හා ළූණු බීජ සමඟ වල් පැළෑටිවල බීජ බොහෝමයක් ද මෙරටට පැමිණ තිබේ. මේ තත්වය තවදුරටත් වර්ධනය වුවහොත් අප රටේ කෘෂිකර්මාන්තයට දරුණු ගැටලුවලට මුහුණ දීමට සිදු වනු නොඅනුමානයි. එබැවින් ඉන්දියානු බීජ සමාගම් අප රටේ බීජ නිෂ්පාදන අයිතිය තහවුරු කර ගැනීමට දරන උත්සාහය හා ගුණාත්මක බවින් තොර, නිරෝධායනය නොකළ බීජ ගෙන්වීමේ ක්‍රියාවලිය නතර කිරීමට වහාම පියවර ගත යුතුය. එපමණක් ද නොව ශාක ආරක්ෂණ පනතේ 12 (2) (ආ), (ඇ), (ඈ), (ඉ) යන උප වගන්තිවලට අදාළව ශාක හෝ ශාක කොටස් ආනයනය කිරීමේ දී වැදගත් වන සීමාවන්, තහනම් කිරීම් හා නිරෝධායන නීති ශක්තිමත් කිරීම සඳහා බලපත්‍ර ක්‍රියාවලිය හා කොන්දේසි පැනවීම සඳහා වන දැනට සකස් කර ඇති නියෝග කඩිනමින් ගැසට් නිවේදන මඟින් බලාත්මක කළ යුතු ව ඇත.

එසේ නොමැති වුවහොත් ලංකාවේ බීජ ආනයන ක්‍රියාවලිය යටතේ හෝ ශාක ආනයන ක්‍රියාවලිය යටතේ හෝ රටේ කෘෂිකර්මාන්තයට හා ස්වභාවික පරිසර පද්ධතිවල පැවැත්මට බලපෑම් ඇති කරන ජීවීන්ගේ පැමිණීම පාලනය කළ නොහැකි වන අතරම ගුණාත්මක බවින් යුතු බීජ ලංකාවේ භාවිතා කිරීමට ඇති අයිතියටද බලපෑම් එල්ල වනු ඇත. මේ තත්වයන් පාදක කොටගෙන ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තයට සිදු විය හැකි අනිසි බලපෑම් පාලනය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතු බව අවධාරණය කර සිටිමු.

*පරිසරවේදී සජීව චාමිකර මහතාගේ ලිපියක් ඇසුරෙනි*

## The Gadget

# ගණංකාරයින්ට App එකක්





උසස් පෙළ Maths කරන අයටම වටිනා ඇප් එකක් ඇවිල්ලා තියෙනවා. ඒකට කියන්නෙ MathsApi කියලයි. මෙය සංයුක්ත ගණිතය, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය හා සාමාන්‍ය ඉංග්‍රීසි ආදී විෂයන්වලට ගොඩාක් ප්‍රයෝජනවත් වෙනවා.

පසුගිය වසර 28ක උසස් පෙළ ප්‍රශ්න පත්‍ර වගේම වසර 6ක උසස් පෙළ ලකුණු දීමේ පටිපාටියක්, පාසල් වාර විභාග හා අනුමාන ප්‍රශ්න පත්‍රත් මේ තුළින් ලබාගන්න පුළුවන්. ඒ විතරක් නෙවෙයි උසස් පෙළ ගණිතය හා විද්‍යා අංශයට අදාල වීඩියෝ හා කෙටි සටහන්ද ඇතුලත් වෙලා තිබෙනවා.

උසස් පෙළ ගණිතය හා විද්‍යා අංශවලට අයත් අලුත්ම පුවත්, අධ්‍යාපනික ලිපි, විශ්වවිද්‍යාලවල පවත්වන අභියෝගතා පරීක්ෂණ ප්‍රශ්න පත්‍ර, ගණිතය අංශයෙන් උසස් පෙළ අවසන් කර විශ්වවිද්‍යාල වරම් අහිමි වූවන් සඳහා රාජ්‍ය අධ්‍යාපන ආයතන මගින් ලබාදෙනු ලබන ඩිප්ලෝමා පාඨමාලා පිළිබඳ විස්තර හා ඒ සඳහා ඇතුළත් වීමේ අභියෝගතා පරීක්ෂණවල ප්‍රශ්න පත්‍ර ආදී වටිනා තොරතුරු මෙම ඇන්ඩ්‍රොයිඩ් ඇප් එකේ ඇතුළත් වී තිබෙනවා.

# ලෝකෙ ලොකුම කෘත්‍රිම දූපත

ලොව විශාලතම කෘතිම දූපත පිහිටා තිබෙන්නේ ඩුබායිවලයි. මෙම කෘතිම දූපත ලෝකයේ ඉංජිනේරුවන්ගේ තවත් විස්කමක් බවට පත්වෙලා. පර්සියානු හා අරාබියේ ගල්ෆ් ආදී ප්‍රදේශවලින් ගෙන එන වැලි ඉසීමෙන් මෙම දූපත් ගොඩකර තිබෙනවා. පසුව ජී.පී.එස් තාක්ෂණය යොදාගනිමින් ගැඹුරු මුහුද කම්පනයට පත්කරමින් තමයි හැඩය සකස් කරගෙන තියෙන්නේ. මෙම දූපත පාම් ජුමේරාහි ඇති තාල වර්ගයේ වෘක්ෂයක හැඩයකට අතු 17කින් සමන්විතව නිර්මාණය කර තිබෙනවා. නිවාඩු නිකේතන 1500කින් යුක්ත මේ දූපතේ පිහිටි කෘතිම මුහුදු වෙරළ තීරය හා සුඛෝපභෝගී හෝටල් සමූහය නිසාද එහි සුන්දරත්වය දෙගුණ තෙගුණ වී තිබෙනවා.





## Sports



# මහත් හොරුන්ගේ ක්‍රීඩාවක් කළ T-20

IPL, CPL, BPL, PSL හා Big Bash වැනි 20-20 ලීග් තරඟාවලි ලොව පුරා ශීඝ්‍රයෙන් ජනප්‍රිය වෙමින් පවතී. අද වනවිට ක්‍රිකට් ක්‍රීඩාවේ ජනප්‍රියතම මෙන්ම පොදුවේ ක්‍රීඩකයින් මෙන්ම ප්‍රේක්ෂකයින් ඇදබැඳ ගැනීමට සමත්ව ඇත්තේ 20-20 (T-20)තරඟයි. මෙම තත්වය ක්‍රිකට් ක්‍රීඩාවට හානිදායක වටපිටාවක් නිර්මාණය කිරීම වෙනුවෙන් දායක කරගැනීම කණගාටුවට කරුණකි. එමෙන්ම මෙවැනි වටපිටාවක් තුළ ක්‍රිකට් ක්‍රීඩාවේ අනාගතය පිළිබඳව ඇත්තේ බොඳ වූ චිත්‍රයකි.

ක්‍රිකට් ක්‍රීඩාව මුදල් මත විකිණීම හා අලෙවි වීම දැන් දැන් ඉතාම ප්‍රසිද්ධියේ සිදුවෙමින් පවතී. වැඩිම ලංසුවකට අලෙවි වීම ක්‍රීඩකයින්ගේ අරමුණ බවට පත්වූ වටපිටාවක් තුළ තම රට හා තම කණ්ඩායම වෙනුවෙන් ක්‍රීඩා කරනවා වෙනුවට දැන් දැන් තමාට වැඩිම මිල ගෙවන ලීග් කණ්ඩායමක් වෙනුවෙන් ක්‍රීඩා කිරීම ක්‍රිකට් ක්‍රීඩාවේ ජීවගුණයටත් ක්‍රිකට් ක්‍රීඩාවේ තිරසාර සංවර්ධනයටත් දැඩි බාධාවක් කරමින් තිබේ. එමෙන්ම එය බොහෝ රටවල්වල කණ්ඩායම් තුළ තිබූ ශක්තියට මරු පහරක් එල්ල කරමින් ඇත.

මීට කදිම නිදසුන වන්නේ 1975 සහ 1979 දී පිට පිට දෙවතාවක් ලෝක කුසලානය දිනාගත්, ක්‍රිකට් ඉතිහාසය තුළ තම නමින් පරිච්ඡේද ගණනාවක්ම ලියාගත්, ස්වකීය ආරකින් ක්‍රිකට් ක්‍රීඩාවේ නියැලෙමින් ලොව ක්‍රිකට් වංශකතාවේ ප්‍රබල කණ්ඩායමක් වුණ බටහිර ඉන්දීය කොදෙව් කණ්ඩායමට අද අත්වී ඇති ඉරණමයි.

2019 දී පැවැත්වීමට නියමිත ලෝක කුසලාන තරඟාවලිය වෙනුවෙන් පැවැත්වෙන සුදුසුකම් ලබාගැනීමේ තරඟාවලිය මාර්තු මස 04 දින 25 දින දක්වා සිම්බාබ්වේදී පැවැත්වුණි. මෙම තරඟාවලියට බටහිර ඉන්දීය කොදෙව් කණ්ඩායමේ ප්‍රබල ක්‍රීඩකයින් වන කරන් පොලාර්ඩ්, ඇන්ඩෘ රසල්, සුනිල් නරේන් හා ඩැරන් බ්‍රාවෝ යන ක්‍රීඩකයින් සහභාගී නොවීය. ඒ ඔවුන්ට එක්දින සීමිත ඕවර් තරඟාවලියක් වන ලෝක කුසලානයට තෝරාගැනීමේ තරඟයට වඩා 20-20 දේශීය තරඟාවලියක් වන පාකිස්ථාන සුපර් ලීග් තරඟාවලියට සහභාගී වීම වැදගත් බව පවසමින්ය.

මෙවැනිම අත්දැකීම් ශ්‍රී ලංකා කණ්ඩායම තුළ ද අපට දක්නට ලැබුණි. ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායමේ නවතම පුහුණුකරු වන චන්දික හතුරුසිංහ පසුගිය දිනෙක ප්‍රකාශ කළේ 20-20, ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාවේ ජීවගුණයට හානි කරමින් සිටින බවයි. මෙම ප්‍රකාශයට එකඟ වෙමින් බොහෝ පුහුණුකරුවන් හා ක්‍රීඩකයින් අදහස් දක්වා තිබුණි.

එංගලන්ත පුහුණුකරුවකු වන ට්‍රෙවර් බේලිස් ප්‍රකාශ කරන්නේ මෙම 20-20 ලීග් තරඟාවලි මඟින් ක්‍රීඩකයින් හා පුහුණුකරුවන් දැඩිව පීඩාවට පත්කරන බවයි. "මම නම් ඔය 20-20 සෙල්ලම් කරන්නෙ නෑ. මම ඒක කණ්ඩායම් අයිතිකාරයින්ටම කරගන්න කියනවා. අපි මේ විදියට ක්‍රීඩා කරන්න ගියොත්, යම්කිසි අවස්ථාවකදී පුපුරා යන්න පුළුවන්."

නමුත් එංගලන්ත පුහුණුකරුගේ අදහසට එරෙහිව කරුණු දක්වමින් නවසීලන්ත කණ්ඩායමේ පුහුණුකරු වන මයික් හෙසන් කියා සිටියේ මෙසේය. "ක්‍රීඩකයින් මෙන්ම පුහුණුකරුවන්ද වෙහෙසවීම සම්බන්ධයෙන් ප්‍රශ්නයක් තියෙනවා. ඒත් ආදායම් ඉපයීම පිළිබඳවත් හිතන්න ඕනෑ." ඉදින් ක්‍රිකට් ක්‍රීඩාව ආදායම් උපයාගන්නා මාර්ගයක් ලෙස යොදාගන්නා වටපිටාවක් තුළ එහි අනාගතය කෙබඳු වේද?

ශ්‍රී ලංකාවෙන් බිහිවූ ප්‍රවීණ ක්‍රිකට් ක්‍රීඩකයෙක් වන කුමාර් සංගක්කාර ද පවසන්නේ හතුරුසිංහගේ අදහසට සමාන අදහසකි. "ටෙස්ට් ක්‍රිකට් ක්‍රීඩාවට වැඩිපුර යොමුවිය යුතු තරුණ ක්‍රීඩකයින් 20-20 තරඟ රටාවට යොමුවෙලා තියෙනවා. එය කණගාටුවට කරුණක්. ටෙස්ට් ක්‍රිකට් කියන්නෙ මොකක්ද කියන එක ප්‍රේක්ෂකයින් වගේම ක්‍රීඩකයිනුත් දැනගන්න ඕනා. ක්‍රීඩාව සංවර්ධනය කිරීම හා පවත්වාගෙන යාම තිරසාර විය යුතුයි."

වරෙක ප්‍රසිද්ධ ඕස්ට්‍රේලියානු ක්‍රිකට් විස්තර විචාරක රිස් බෙනෝ විසින් මෙලෙස පවසා සිටියේය. කොදෙව් දේශයට ආවේණික කැලිප්සෝ ක්‍රිකට්ද, පාකිස්ථානයට ආවේණික අවිනිශ්චිත හා ප්‍රවේගකාරී ක්‍රීඩා රටාවද, ශ්‍රී ලංකාවට ආවේණික නිසොල්මන් හා ඉතා සටන්කාමී ක්‍රීඩා විලාසයද ලෝක ක්‍රිකට් ක්‍රීඩාවට අහිමිව ගිය කලෙක ලෝක ක්‍රිකට් ක්‍රීඩාව අඩක් අකර්මණ්‍ය වූ රෝගියෙකු බවට පත්වනු ඇත." සැබවින්ම එම ප්‍රකාශයෙහි වලංගුතාවය තවදුරටත් තීව්‍ර කරමින් ආදායම් ගැන පමණක් සිතමින් කටයුතු කිරීම, ලෝක ක්‍රිකට් ක්‍රීඩාවටත් එහි ජීවගුණයට හා විචිත්‍රත්වයටත් හානිකරමින් පිළිලයක් බවට පත්ව ඇත. මෙය ලෝක ක්‍රිකට් ක්‍රීඩාවට එල්ල කරන ලද මරු පහරක් වන්නේ එබැවිනි.

එසේනම් විසඳුම කුමක්ද? T-20 තහනම් කිරීම ද? නැතහොත් ස්වකීය හැකියාවන් තව තවත් ප්‍රගුණ කරමින්, පුද්ගලික ලාභ අපේක්ෂාවන්ට එහා ගිය ජයග්‍රහණයන් රට වෙනුවෙන් අත්පත් කරදෙමින්, සිදුවීමට නියමිත ව්‍යසනයෙන් ලෝක ක්‍රිකට් ක්‍රීඩාව මුදවාගැනීමයි ද?

# පැරා ඔලිම්පික් 2018




මෙවර පැරා ඔලිම්පික් උලෙළ දකුණු කොරියාවේ පියොන්ග් චැන්ග් හිදී මාර්තු මස 09 සිට 18 දක්වා පැවැත්විණි. ක්‍රීඩා තරඟ 86ක් සඳහා රටවල් 49 ක් නියෝජනය කරමින් ක්‍රීඩක ක්‍රීඩිකාවන් 569 දෙනෙක් ඊට සහභාගී වූහ. සමස්ත තරඟාවලිය තුළ පදක්කම් 36ක් ලබාගනිමින් පදක්කම් සටහනේ පෙරමුණ ගත්තේ ඇමරිකාවයි. දෙවන ස්ථානය පදක්කම් 24ක් ලබාගත් ඔලිම්පික් ධජය යටතේ ක්‍රීඩා කළ කණ්ඩායමටත්, තුන්වන ස්ථානය පදක්කම් 28ක් ලබාගත් කැනඩාවටත් හිමි විය.

මෙවර පැරා ඔලිම්පික් උලෙළහි ලෝකයේම අවධානය යොමු වූ ප්‍රධානම කාරණාව වූයේ දකුණු කොරියාවේ පැවති මෙම තරඟාවලියට උතුරු කොරියාව සහභාගී වීම හා දෙරටම එකම ධජයක් යටතේ සමාරම්භක උලෙළ නියෝජනය කිරීමත්ය. මෙය ඇමරිකාවට එල්ල වූ සියුම් ප්‍රහාරයක් ලෙසද ලෝක මාධ්‍ය විසින් වාර්තා කර තිබුණි.

# නිදහස් කුසලානය පරාදයි..




පසුගිය දා පැවති නිදහස් කුසලාන ක්‍රිකට් තරගාවලිය නිමා වූයේ ඉන්දියාවට තරඟාවලියේ ජයග්‍රහණය හිමිකර දෙමින්ය. මෙහි අවසන් මහා තරඟය කාගේත් අවධානයට යොමු වූයේ ලාංකික ප්‍රේක්ෂකයින් විසින් බංගලාදේශ කණ්ඩායමේ පරාජය වෙනුවෙන් ඉන්දියානු කණ්ඩායමට සහයෝගය දැක්වූ නිසාය. ක්‍රිකට් ඉතිහාසය තුළ ශ්‍රී ලංකාවේ දී ඉන්දියානු කණ්ඩායමකට හිමිවූ උපරිම සහයෝගය මෙහිදී හිමි විය. නමුත් මෙම තරඟාවලිය පුරාම දක්නට ලැබුණු ආවේගශීලී හා ක්‍රිට් ක්‍රීඩාවේ ජීව ගුණයට හානි කරමින් හැසිරුණු අවස්ථා සම්බන්ධයෙන් බොහෝ දෙනෙක් තුළ ඇත්තේ බරපතළ කණගාටුවකි.

එමෙන්ම ශ්‍රී ලංකා ප්‍රේක්ෂකයින් විසින් තරඟාවලිය ආරම්භයේදී තම ප්‍රධාන ප්‍රතිවාදියා බවට පත්කර ගත්තේ ඉන්දියානු කණ්ඩායමයි. ඉන්දියානු ක්‍රිකට් පරිපාලනය විසින් මෙම තරඟාවලිය සඳහා දෙවන පෙළ කණ්ඩායමක් නම් කිරීම මෙයට ප්‍රධානම හේතුවයි. නමුත් අවසානයේ දී ශ්‍රී ලංකා කණ්ඩායම අවසන් පූර්ව වටයෙන් බංගලාදේශ කණ්ඩායම හමුවේ පරාජයට පත්වීම හා එහිදී ඇති වූ සිදුවීම් කීපයක් හේතුවෙන් තම ප්‍රධාන ප්‍රතිවාදියා වූ ඉන්දියාවට සහයෝගය පළකිරීම කාගේත් කතාබහට ලක් විය. කෙසේ වුවද ක්‍රීඩාවේ ජය පරාජයන් දරාගැනීමට නොහැකිව හැසිරෙන ක්‍රීඩකයින් පිළිබදවත්, ප්‍රේක්ෂකයින් පිළිබදවත් මෙන්ම මෙවැනි ආදර්ශයන් පිළිබඳවත් අවධානය යොමු කර ක්‍රිකට් ක්‍රීඩාවේ ජීවගුණය රැකගැනීම ක්‍රීඩා බලධාරීන්ගේ මෙන්ම ප්‍රේක්ෂකයන්ගේත් ක්‍රීඩකයින්ගේත් වගකීම වන්නේය.

# කවි නිර්මාණය

**ඔබගේ නිර්මාණ සඳහා ඉඩක්**

ඔබගේ කවි නිර්මාණ අප වෙත එවන්න.
අප සූදානම් ඔබගේ නිර්මාණ සඳහා ඉඩක්

FORWARD කවි පිටුවේ වෙන්කරන්න.
මෙන්න අපගේ ලිපිනය

*FORWARD කවිපිටුව,*
*අංක 464/20, පන්නිපිටිය පාර,*
*පැලවත්ත, බත්තරමුල්ල.*

## එක් බක්මහක..

පිපී මුකුලිතව
සුවඳ හමාගෙන
නැවුම් ලොවක
බලාපොරොත්තුව
දැනෙන්න ගත්තා පමණි...
රතින් පිරි
එරබදු මල් පිපෙන
බක් මහේ රක්ත රුධිරය
ගලා ගියේ
මේ පොළොව මත...

**] අයේශ් ශෂීමාල් - තංගල්ල[**

## අපි එකම පංතියේ

නිලාර් කාසීම් රිෆ්නා
අපි එකම පංතියේ........
දවස ගාණේ මාළු අඩුවෙන
එකම ගාණට ලුණු ඉහුව බත.......
අම්මා කියනවා දන් වසලු......!
එකම මේසේ වටේ ඉඳගෙන
රසට ඒ බත්පත අනාගෙන
අපි කෑවේ එකටමයි.......
නීලා සෙල්වමුත් අපි එක්කල
කන්න ගත්තා විතරමයි....
එදා අම්මා විසයි කියපු
ලඩ්ඩුත් අද තියෙනවා...
එක ලඩ්ඩුව වුණත් අපිට
ඒ පැණිරස දැනෙනවා...
ඉතින් අම්මේ........
අපිත් එක්කල කතා නොකරන
පොඩ්ඩ ඇත්තන් අපට ගස්සන
උනුත් පංතියේ ඉන්නවා....
කලෙක විස කලෙකදී රස වෙන
කලෙක රස කලෙකදී විස වෙන
අම්මගේ ඔය පාඩමේ මට
නොතේරෙන තැන් තියෙනවා.....

**] මියැසි - රුහුණු විශ්වවිද්‍යාලය[**

## රතු මල් පොකුර

තුරු මුදුන මත පිපුණ
නුඹයි රතු මල් පොකුර
සිනාවෙන් තවත් මල්
පුබුදන්න වෙර දරන..

හමා එන සුළඟ වෙත
විසල් පෙති දිගහරින
මහා රුක් මව් රකින
මල් පොකුර නුඹමය..

වියැළෙමින් යන ලෝකයට
හෙවණ දී සනසවන
සෙනෙහසින් ලොව නිවන
තුරු මව්ගෙ පුතු නුඹය...

**] සඳුනි නුවන්තිකා - හම්බන්තොට[**



## අපේ ආදරේ...

නන්දිකඩාල් කලපුව ළඟ
හැරෙන වංගුවේ...
නුඹ හිටියා මතක් උනා
යද්දි යාපනේ...
ආදරයට කම්බි වැටක්
ගහපු හංදියේ...
මූනිස්සම් වැටිලා තිබුණා
එදා නංගියේ...
වෙඩි වරුසා වහින්නේ නැති
උනත් රට තොටේ...
හිත අස්සෙන් වැහි වහිනවා
අපේ ආදරේ...
ජාතිවලට සාප දියන්
හෙටත් නංගියේ...
වැට මායිම්වලින් බෙදිලා-
අදත් ආදරේ...

**] තරිඳු කුමාරගේ - කඩුවෙල[**

## එක දවසක..

සරෝජා
නයනා
ෆාතිමා
සෙල්වරාජා
තිලක්
මොහොමඩ්

කෝවිල
පන්සල
පල්ලිය
බලයි අප දෙස සැකයෙන්
අප මින්සුන්
වූ
දවසට...

**] සඳමාලි එදිරිසිංහ - අනුරාධපුර [**

## අපි ගැන

හන්තාන මොකුත් නොකීවාද
තුරු පෙළ අහක බැලුවාද
මහවැලිය නිහඬව උන්නාද
විමසන විටක මං ගැන...

රොබරෝසියා මල් ගාව
දොඩමළු වූ මතක පද
අරගල බිමට වැටුණාම
හැඬුවාද රහසේම...
නුඹ කිසිත් නොකියාම
මහ සෙනහසක් සඟවාන...

**] දිනූෂ පරණවිතාන - තිස්සමහාරාම[**

# අස්ථාවර සමාජයක හෙටක් ගැන හිතන්නත් අමාරුයි



සරත් කරුණාරත්න

### ඔබව හඳුන්වා දෙන්න කැමති කොහොමද?

මම රංගන ශිල්පියෙක් ලෙස හඳුන්වා දෙන්න කැමතියි.

### ඔබ කලාවට යොමුවුණු ආකාරය සඳහන් කළහොත්...

මම උසස් පෙළ කරන කාලයේ පටන්ම කලාව පිළිබඳ හැදෑරීමක් කළා. ඉන්පසු තරුණ සේවා සභාවේ හැදෑරීමක් කරලා අනතුරුව රඟපෑම වෙත යොමු වුණා. කොහොම නමුත් බොහෝදුරට කලාව පිළිබඳ හැදෑරීමක් හා ඉගෙනීමක් ලැබුවේ රඟපෑම තුළින්මයි. ඊට අමතරව කැළණිය විශ්වවිද්‍යාලයේ නාට්‍ය හා රංග කලාව පිළිබඳ බාහිර උපාධිය හදාරමින් සිටිනවා.

### අපේ රටේ කලාව පිළිබඳ ඔබේ අදහස කුමක්ද?

කලාව ගැන සඳහන් කළොත් එය මිනිසුන්ට විඳින්නට පුළුවන් ආකාරයෙන් තිබිය යුතුයි. ඒ වගේම එය විසින් ප්‍රේක්ෂකයාට පවසන දේ ඉතා වැදගත්. මිනිසුන්ට යහපත් සමාජයකට අවශ්‍ය පෙළඹවීමක් සිදුකළ හැකි නම් එය යහපත් කලා කෘතියක් වෙනවා. මම හිතන ආකාරයට පෑනට පුළුවන් මිනිස්සු හිතන ආකාරය වෙනස් කරන්න. මිනිසුන් වෙනස් වුනොත් සමාජය වෙනස් කරන්න පුළුවන්. නමුත් අද වනවිට මිනිස්සුන්ව යහපත් විදිහට හිතන පොළඹවන කලා කෘති නිර්මාණය නොවන තරම්. බොහෝදුරට මේ රටේ ටෙලිනාට්‍ය කලාවට සිදුවී තිබෙන්නේ රූපවාහිනී ආයතනවල රේටින් හා ලාභය මත පදනම්ව ටෙලිනාට්‍ය නිර්මාණය කිරීමටයි. මෙම ටෙලිනාට්‍යවල රඟපාන නිළියන් හා තේමාව පවා රූපවාහිනී ආයතන විසින් තමන්ට උවමනා පරිදි හසුරුවන ආකාරයක් දැකගත හැකියි. මෙයින් යම්තාක් දුරකට හෝ බේරී පවතින්නේ වේදිකා නාට්‍ය පමණයි.

### සම්මාන ලැබීම කලාකරුවෙකුගේ ජීවිතයට කෙතරම් දුරට උපකාරී වෙනවාද?

ලංකාවේ සම්මාන දෙන, දීපු ආකාරය ගැන විතරක් තෘප්තිමත් නැහැ. හැබැයි, ඒ දෙන සම්මානය යම්කිසි වටිනාකමක් තිබෙන ආකාරයට ලැබෙනවා නම් ඒක ඔවුන්ට ලොකු ජවයක්. තමන් කරන කාර්යයට ඇගයීමක් ලැබීම තුළ ලොකු වටිනාකමක් තිබෙනවා. නමුත් ඔය මොන සම්මානය ලැබුණත් කලාකරුවාට හා ප්‍රේක්ෂකයාට උපරිම සති 02ක් පමණ මතකයේ තියෙයි. මගේ අදහස

> මිනිසුන්ට යහපත් සමාජයකට අවශ්‍ය පෙළඹවීමක් සිදුකළ හැකි නම් එය යහපත් කලා කෘතියක් වෙනවා.

නම් සම්මානත් සමඟ කලාකරුවන්ට කලාව පිළිබඳව හැදෑරීම සඳහා විදේශීය හෝ දේශීය ශිෂ්‍යත්ව, විදේශ රටක නාට්‍ය බලන්න යාමට අවස්ථාවන් වැනි දේ ලැබෙනවා නම් එය තමයි කලාකරුවෙකුට දක්වන ලොකුම උපහාරය.

### කලාකරුවෙකුට කලාවෙන් සමාජ මෙහෙයක් සිදුකළ හැකිද?

අනිවාර්යයෙන්ම පුළුවන්. දැන් බලන්න, අද ප්‍රේක්ෂකයාට වෙලා තියෙන්නේ මොකක්ද කියලා. ඔවුන්ට තමන් කැමති කලා කෘතියක් රසවිඳිනවා වෙනුවට පෙනන දෙයක් බලාගෙන ඉන්න සිදුවෙලා. ඒ තුළින් නොදැනුවත්වම ප්‍රේක්ෂකයාගේ රසවින්දනය මොට කරනවා. නමුත් ඒ වෙනුවට යහපත් කලා නිර්මාණයන් බිහිවෙනවා නම් මිනිසුන් තුළ යහපත් සමාජ මතයන් ඇති කළ හැකියි. හැබැයි අද නොකෙරෙන්නෙත් එයමයි. ඉඳහිට හෝ එවන් නිර්මාණයක් බිහිවුවත් අර කලා හැකියාව මොටකරන ලද ප්‍රේක්ෂකයාට එම නිර්මාණය කොතරම් දුරට සමීප වෙනවාද යන්න ප්‍රශ්නයක්. ඒ වගේම තමයි මේ වනවිට ඉතා පහත් ගණයේ ඉන්දියානු ටෙලිනාට්‍ය හරහා අපේ රටේ කලා නිර්මාණයන් මරා දමමින් තිබෙන තත්වයකුත් උදාවෙලා.

### කලා ජීවිතයේ ඔබ ලබාගත් ජයග්‍රහණ ගැනත් සඳහන් කළොත්...

මම මේ මොහොතේ යම්කිසි දෙයක් ලබාගෙන ජීවත් වෙන්නේත් කලාව නිසා. මගේ ජීවිතයට අදාළ සියලුම දේ ලැබෙන්නෙත් කලාව නිසා. ඒ නිසා ඒ සියල්ලම මම ලබපු ජයග්‍රහණ තමයි.

### අපේ රටේ තාරුණ්‍යයට ඔබ ලබාදෙන පණිවුඩය මොකක්ද?

මේ සමාජයේ ඉන්න තාරුණ්‍යට දෙන පණිවුඩය මොකක්ද කියනදේත් ප්‍රශ්නයක්. මොකද ඒ තරුණයාව නිර්මාණය කරන්නේත් මේ සමාජයමයි. ඒ වගේම මේ සමාජය නිර්මාණය කරන්නේ පාලකයෝ. ආයෙමත් ඒ පාලකයින්ව පත්කරන්නේත් එම තරුණයාමයි. ඒ නිසා මට කියන්න තියෙන්නේ එක දෙයයි. මාරුවෙන් මාරුවට පාට මාරු කරමින් පාලකයින්ව හදන්න පාවිච්චි කරන ඡන්දය ගැන ඔබ දැනගත යුතුයි. ඡන්දය යන්නෙහි අර්ථයත් එහි වටිනාකමත් තේරුම් ගෙන නිවැරදිවම භාවිතා කිරීමට සිතා ගතයුතුයි.

### කලාකරුවෙක් හැටියට ඔබේ අනාගත බලාපොරොත්තු මොනවාද?

අස්ථාවර සමාජයක් තිබෙන තැනක හෙට දවසේ කුමක් කළ යුතුද කියා සිතන්නටවත් නොහැකියි. ඒ නිසා මමත් බලාපොරොත්තු රහිත කලාකරුවෙකුගේ තත්වයට පත්වෙලා.



# වැඩවර්ජන හා උද්ඝෝෂණ හේතුවෙන් **ප්‍රංශයම අඩපණ වෙයි**




මැක්‍රොන්ගේ ආණ්ඩුව විසින් ගෙන ආ වැඩකරන ජනතාවගේ සේවක ප්‍රතිසංස්කරණවලට එරෙහිව පැවති විරෝධතා, වැඩවර්ජන සහ වීදි උද්ඝෝෂණ හේතුවෙන් පසුගිය මාර්තු 18 දින මුළු ප්‍රංශයම අඩපණ විය. එම ප්‍රතිසංස්කරණ අතර රාජ්‍ය සේවය කප්පාදු කිරීම සඳහා වසර 5ක් ඇතුළත සේවකයින් 120000 ක් පමණ ඉවත් කිරීම, සේවය ස්ථිර කිරීම වෙනුවට කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම, ස්ථිර වැටුපක් වෙනුවට කුසලතා ක්‍රමයක් අනුව වැටුප් ගෙවීම ප්‍රධාන වේ.

මෙම ප්‍රතිසංස්කරණ තුළින් රාජ්‍ය සේවය හකුළුවා දැමීමට මැක්‍රොන්ගේ ආණ්ඩුව උත්සාහ දරන බවට වෘත්තීය සමිති චෝදනා කරයි. ප්‍රංශයේ තුළ ලක්ෂ 54ක් පමණ රාජ්‍ය සේවකයන් සිටින අතර ඔවුන් නියෝජනය කරන සියලුම වෘත්තීය සමිති මෙම වැඩවර්ජනයට එක් වීම විශේෂත්වයකි. ඒ සඳහා දුම්රිය රියදුරන්, ගුරුවරුන්, හෙදියන්, ගුවන් ගමන් පාලකවරුන් සහ අනෙකුත් රජයේ සේවකයින් ද එක් වූහ. කෙසේ වුවද ඇතැම් ප්‍රදේශවල විරෝධතා සාමකාමී ස්වභාවයක් ගත් නමුත් සමහර ප්‍රදේශවල දී පොලිසිය දැඩි මර්දනයක් ක්‍රියාත්මක කර ඇත. වර්ජනය හේතුවෙන් ගුවන් ගමන්වලින් 30% ක් පමණ අත්හිටුවීමටත්, පාසල් වසා දැමීමටත් සිදු වූ අතර දුම්රිය හා ගමනාගමන කටයුතු විශාල ලෙස අඩාළ විය.



මේ ඉන්නේ "සුඩාන්". ඌ තමයි ලෝකේ හිටපු අන්තිම සුදු රයිනෝසිරස් පිරිමි සතා. අධිරාජ්‍යවාදී සමයේදී අසීමාන්තික ලෙස මරා දැමීම නිසා සුඩාන්ගේ පරපුර වේගයෙන් වඳවෙන්න පටන් ගත්තා. අවසානයේදී සුඩාන් හිටියෙත් හමුදා ආරක්ෂාව යටතේයි. ඉතින් අප ජීවත් වන ලෝකය කොයිතරම් නම් නපුරුද කියලා යෝධ පාඩමක් කියා දී සමුගත් උඹට සුබ ගමන්!

## ෂී ජිංපින් ජීවිතාන්තය තෙක් ජනපති



චීන ජනපති ෂී ජිංපින් ජීවිතාන්තය දක්වා චීනයේ ජනාධිපතිවරයා ලෙස පිළිගැනීමට නියමිතය. චීනයේ ජනාධිපතිධූරය සඳහා මෙතෙක් පැවති සීමාවන් ඉවත් කිරීමට එරට පාර්ලිමේන්තුව තීරණය කර ඇත. එහි පාලක කොමියුනිස්ට් පක්ෂය විසින් එම යෝජනාව චීන පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇති අතර ඊට පක්ෂව ඡන්ද 2964ක් හිමිව තිබිණි. එසේම චීන කොමියුනිස්ට් පක්ෂ රැස්වීමේදී මහජන චීන සමූහාණ්ඩුවේ අසහාය නායක මාඕ සේතුං හා සම තත්වයෙහි ලා ෂී ජිංපින් පිළිගැනීමටද එම පක්ෂය පියවර ගෙන ඇත්තේය.


## උතුරු කොරියාව හා දකුණු කොරියාව අතර හමුවක්



2007 වසරට පසුව හා 2011 කිම් ජොංග් උතුරු කොරියානු නායකයා බවට පත්වූ පසුව ප්‍රථම වරට දකුණු කොරියානු නියෝජිත පිරිසක් උතුරු කොරියාවට පැමිණ ඇත. මෙම ඓතිහාසික හමුව ඉතිහාසය අලුතින් ලියැවෙන මොහොතක් බවට වාර්තා වේ. දකුණු කොරියාවේ ජාතික ආරක්ෂක කාර්යාලයේ නියෝජිතයින් 10 දෙනෙකු සහ උතුරු කොරියානු නායකයා අතර පැවති මෙම හමුවේදී දකුණු කොරියානු ජනාධිපති මුන් ජේ ඉන් විසින් එවූ ලිපියක්ද උතුරු කොරියානු ජනාධිපතිවරයාට භාරදී ඇත.

මෙහිදී අදහස් දැක්වූ උතුරු කොරියානු නායකයා පෙන්වා දී ඇත්තේ මෙම තත්වය හොඳින් පවත්වාගෙන යාම සිය අභිලාෂය බවත් යළි එකතු වීමේ කටයුතු ඉදිරියටත් සිදුකළ යුතු බවත්ය.

## රුසියානු ජනාධිපතිවරණය 2018



මෙවර රුසියානු ජනාධිපතිවරණයේ ජය යළිත් වරක් පුටින් වෙතම ලැබී ඇත. ඒ අනුව වසර 2024 දක්වා තවත් වසර 6ක ධූර කාලයක් ඔහුට හිමිව තිබේ. ඔහු ලබාගෙන ඇති සමස්ත ඡන්ද ප්‍රතිශතය 76.6%කි. පසුගිය වසර 18 තුළම ඔහු රුසියාවේ ජනාධිපතිධූරය හිමිකර ගෙන ඇත. ජයග්‍රහණයෙන් පසු රුසියාවේ මොස්කව් නුවර රතු චතුරස්‍රයේදී ජනතාව ඇමතූ පුටින් මේ එක්සත් බව පවත්වා ගෙන යාම වැදගත් බවත් බටහිරට එරෙහිව රුසියාවේ ආරක්ෂාව තවදුරටත් ඉහළ නැංවීමට කටයුතු කරන බවත් පවසා ඇත.

එසේම රුසියානු මෑත ඉතිහාසයේ වඩාත් විනිවිදභාවයෙන් හා විවෘතව පැවැත්වූ ජනාධිපතිවරණය මෙය බවද විශ්ලේෂකයින් විසින් පෙන්වා දේ. මෙවර සුදුසුකම් ලබා තිබූ ඡන්දදායකයින් සංඛ්‍යාව මිලියන 111ක් විය. දැනට ජාත්‍යන්තර අභ්‍යවකාශ මධ්‍යස්ථානයේ රැඳී සිටින රුසියානු ගගනගාමීන් කිහිපදෙනෙකු ද එහි සිට සිය ඡන්දය ප්‍රකාශ කිරීමට නියමිත වුණි. තවද මෙම ජනාධිපතිවරණය සඳහා ස්වයංක්‍රීය ස්කෑනරයක් සහිත නවීන ඡන්ද පෙට්ටි භාවිතා කිරීමද සුවිශේෂීය.

## මුම්බායිහි ගොවි ආක්‍රමණයක්



තමන් ලබාගෙන ඇති වගා ණය සඳහා සහනයක් ලබාදෙන ලෙසත් තම නිෂ්පාදන සඳහා වඩාත් හොඳ මිලක් ලබාදෙන ලෙසත් ඉල්ලා ඉන්දියාවේ ගොවීන් 30000කට අධික පිරිසක් මුම්බායි නුවරට රැස්ව උද්ඝෝෂණ පැවැත්වීය. ඉන්දීය රජය මඟින් පසුගිය වසරේ ලබාදීමට පොරොන්දු වූ ණය සහන ලබාගැනීමත් තම නිෂ්පාදන සඳහා දැනටම සිදුකරන වියදම මෙන් එකහමාරක මුදලක් ඉල්ලා සිටීමත් අරමුණු කර ගනිමින් මෙය සංවිධානය කර තිබුණි. ඒ අනුව හැකි ඉක්මනින් මෙම ගැටලු විසඳීම සඳහා ගොවීන් සමඟ සාකච්ඡා කරන බව මහා රාෂ්ඨ ප්‍රාන්ත රජය පවසයි.

## බ්‍රිතාන්‍යය-රුසියා අර්බුදය උග්‍ර වෙයි



බ්‍රිතාන්‍ය තුළ සේවයේ යෙදී සිටි රුසියානු රාජ්‍ය තාන්ත්‍රික නිලධාරීන් 23 දෙනෙකු එරටින් පිටකිරීමට බ්‍රිතාන්‍ය අගමැතිනි තෙරේසා විසින් පියවර ගෙන ඇත. 66 හැවිරිදි රුසියාවේ හිටපු ඔත්තුකරුවෙක් බ්‍රිතාන්‍ය තුළදී විෂ රසායනික ප්‍රහාරයකට ලක්වීම හේතු කර ගනිමින් ඇය මෙම තීරණය ගෙන තිබේ. මෙම විෂ රසායනිකය සීතල යුද්ධ සමයේදී රුසියාව භාවිතා කළ එකක් බවට වාර්තා වී ඇත.

කෙසේවුවද එක්සත් ජාතීන්ගේ ආරක්ෂක කවුන්සිලයේදී ඇ.එ. ජනපදය ඇතුළු බ්‍රිතාන්‍යයට හිතවත් රාජ්‍යයන් බ්‍රිතාන්‍ය වෙනුවෙන් පෙනී සිට ඇත. එහෙත් ආරක්ෂක කවුන්සිලය වෙනුවෙන් අදහස් දැක්වූ රුසියානු නියෝජිතවරිය පවසා සිටියේ මෙම සිදුවීම බ්‍රිතාන්‍යය විසින්ම ඇති කරවූ එකක් බවත් ඉදිරියේදී රුසියාවේ පැවැත්වීමට නියමිත ලෝක කුසලාන පාපන්දු තරඟාවලිය ඉලක්ක කරමින් කළ අසත්‍ය ප්‍රචාරයක් බවත්ය.

දැනුම

විශ්වයේ බිහිවීම 06 කොටස



# කළු කුහර

# BLACK HOLE



**පසුගිය කලාපයේ පළ වුණු ''අපට තරු පේන හැටි'' ලිපියෙන් ආලෝක වර්ෂයක් යනු කුමක්ද යන්නත්, තරුවක පෙනුම හා තරු මායම් පිළිබඳ-වත් අපි සාකච්ඡා කළෙමු. එමෙන්ම ගැලැක්සි හෙවත් මන්දාකිණියක් යනු කුමක්ද යන්නත් සාකච්ඡා කළ අතරම අද අපගේ ප්‍රයත්නය කළු කුහර යනු මොනවාද යන්න සාකච්ඡාවට බඳුන් කිරීමයි.**

## මොනවද මේ කළු කුහර කියන්නේ?

''කළු කුහරයක්'' යනු අවකාශයේ පවතින ගුරුත්වාකර්ෂණය ඉතා ඉහළ අවස්ථාවකි. එම අධික ගුරුත්වය නිසා ආලෝකය පවා ඉන් ඉවතට නොවිහිදේ. එනම් ආලෝකය පවා එමඟින් උරා ගනු ලබයි. එම අධික ගුරුත්වයට හේතුව වන්නේ කුඩා අවකාශයක තෙරපෙමින්, ගුලිවෙමින් පැවතීමයි. මෙසේ වන්නේ තාරකාවක් මිය ගිය පසුවයි.
ආලෝකය ඉන් පිටතට නොපැමිණීම නිසා මනුෂ්‍ය වර්ගයාට එය දැකිය නොහැකිය. එනම් අදෘශ්‍යමාන වේ. විශේෂිත උපකරණවලින් සමන්විත අභ්‍යවකාශ දුරේක්ෂ ''කළු කුහර'' සොයාගැනීම සඳහා මහෝපකාරී වී ඇත. මෙම විශේෂිත උපකරණ මඟින් කළු කුහර ආසන්නයේ පවතින තාරකා-වන්ගේ හැසිරීම අනෙකුත් සාමාන්‍ය තාරකාවන්ගේ හැසිරීමෙන් වෙනස් වන ආකාරය නිරීක්ෂණය කිරීමට හැකි වී ඇත.

## කළු කුහර ඇති වූයේ කෙසේද?

විද්‍යාඥයින්ගේ මතය වන්නේ කුඩාම ප්‍රමාණයේ කළු කුහර විශ්වය ආරම්භයේ සිටම පැවති බවයි.
කළු කුහර මියැදෙන හෝ විනාශ වන ඉතා විශාල තාරකා මධ්‍යයේ නිර්මාණය වේ. මෙම සිදුවීම සුපර්නෝවාවකට හේතු වේ. එසේම කළු කුහර සියල්ලම විශ්වය තුළ එකම කාල වකවානුවකදී නිර්මාණය වූ ඒවා බවටද සමහර විද්‍යාඥයෝ මත පළ කරති.


## කළු කුහර විශාල වන්නේ කෙසේද?

කළු කුහර විශාල හෝ කුඩා ඒවා වශයෙන් පැවතිය හැකියි.
විද්‍යාඥයින්ගේ මතය වන්නේ කුඩාම ප්‍රමාණයේ කළු කුහරයන් පරමාණුවකටත් වඩා කුඩා බවයි.
එහෙත් කළු කුහරයක් කුඩා වුවද විශාල ස්කන්ධයකට හිමිකම් කියයි. මේ අතර "ස්ටෙලා" නමින් හැඳින්වෙන වෙනත් කළු කුහර වර්ගයක්ද පවතී. එහි ස්කන්ධය සූර්යයා මෙන් විසි ගුණයක් පමණ වේ.
මෙවැනි "ස්ටෙලා" වර්ගයේ කළු කුහර දහස් ගණනක් අප මන්දාකිණිය තුළ ද පවතී.
ක්ෂීරපථය මධ්‍යයේ ද විශාල කළු කුහරයක් වන "SUPER MASSIVE" වර්ගයේ කළු කුහරයක් ඇති බව විද්‍යාත්මක සාක්ෂි මඟින් පෙන්වා දෙනු ලැබ තිබේ. එවැනි කළු කුහර අති විශාල ස්කන්ධයකින් යුක්ත වේ. එනම් සූර්යයන් මිලිය-නයක ස්කන්ධයකටත් වඩා වැඩිය.
සෑම විශාල මන්දාකිණියක් මධ්‍යයේ මෙම "SUPER MASSIVE" වර්ගයේ කළු කුහර පවතින බව විද්‍යාඥයින් සොයාගෙන ඇත.
අපගේ මන්දාකිණිය මධ්‍යයේ පවතින "SUPER MASSIVE" වර්ගයේ කළු කුහරය "SAGITTARIUS A" නමින් හැඳින්වේ. එහි ස්කන්ධය සූර්යයන් මිලියන හතරක ස්කන්ධයට සමාන වේ. එහි මධ්‍යයේ ඇති අවකාශය පෘථිවිය මෙන් මිලියනයක් පමණ වන බව පැවසේ.

## කළු කුහරවල අදෘශ්‍යමාන බවක් තිබෙද්දීත් විද්‍යාඥයින් ඒවා තිබෙන බව හා තිබෙන ස්ථාන පිළිබඳව දැනගන්නේ කෙසේද?

කළු කුහර දැකිය නොහැකි වන්නේ එහි ඇති ප්‍රබල ගුරුත්වය නිසා ආලෝකය පවා පිටතට යා නොදී කළු කුහර මධ්‍යයටම ඇදගන්නා නිසායි.
නමුත් අධික ගුරුත්වය හේතුවෙන් එම කළු කුහර ආසන්නයේ පවතින තාරකාවන්ගේ හා වායූන්ගේ වෙනස් හැසිරීම් රටාව නිරීක්ෂණය කළ හැක. එමඟින් කළු කුහරවල පිහිටීම පිළිබඳවද අවබෝධයක් ලබාගත හැක.
තාරකාවක් හා කළු කුහරයක් එකිනෙකට ආසන්න වූ විට ප්‍රබල ආ-ලෝක ශක්තියක් නිපදවේ.
මෙවැනි වර්ගයේ ආලෝකයක් පියවි ඇසින් නිරීක්ෂණය කළ නොහැකිය.
විද්‍යාඥයෝ ඒ සඳහා අභ්‍යවකාශයේ පවතින දුරේක්ෂ හා චන්ද්‍රිකා උපයෝගී කර ගනිති.






## කළු කුහරයකට පෘථිවිය විනාශ කළ හැකිද?

කළු කුහර විශ්වය තුළ ඇති තාරකා, චන්ද්‍රයින් හා ග්‍රහලෝක විනාශ කරමින් ගමන් කරන්නේ නැත. එසේම පෘථිවිය කළු කුහරයක් තුළට ඇදීයාමක් සිදුනොවන්නේ අප සෞරග්‍රහ මණ්ඩලය තුළ ප්‍රමාණවත් දුරකින් හා ප්‍රමාණවත් ප්‍රබලතාවයකින් යුතු කළු කුහරයක් නොපිහිටන බැවිනි.
සූර්යයාගේ ස්කන්ධයට සමානව සූර්ය-යා තිබෙන තැනම කළු කුහරයක් පැවතියත් පෘථිවිය එය තුළට ඇදීයාමක් සිදු නොවේ.
එසේම සූර්යයා වෙනුවට එය තිබෙන තැනම ඊට සමාන ගුරුත්වයකින් යුතු කළු කුහරයක් පැවතියහොත් පෘථිවිය ඇතුළු අනෙකුත් ග්‍රහලෝක දැන් සූර්යයා වටා ගමන් කරන ආකාරයටම එය වටාද ගමන් කරනු ඇත.

**අප ඊළඟ මාසයේදී Forward තුළින් කතා කිරීමට බලාපොරොත්තු වන්නේ සෞරග්‍රහ මණ්ඩලය පිළිබඳවයි. එයිනුත් අපගේ විශේෂ අවධානය යොමු කිරීමට බලාපොරොත්තු වන්නේ සූර්යයා පිළිබඳව සාකච්ඡා කිරීමටය.**

# බහුජන ව්‍යාපාරය හා විප්ලවවාදී පක්ෂය



ලාංකීය දේශපාලන ඉතිහාසය වූ කලී අතිශය රැවටිලිකාරී හා අන්ත පසුගාමී මෙන්ම බඩගෝස්තරවාදී ලියුම්කරුවන්ගේ කතාන්දරයකි. එම ඉතිහාසය තුළ දක්ෂිණාංශික දේශපාලනය සුලභවත්, වාමාංශික දේශපාලනය දුලභවත් ලියැවිණි. 1971 අධිරාජ්‍ය විරෝධී අරගලය හා 1987-1989 අරගලය ජනතා විමුක්තිය වෙනුවෙන් වූ අරගල ලෙස ඉතිහාසයේ නොලියවුයේ එනිසාය. ලාංකීය තාරුණ්‍යයේ සටන්කාමීත්වය ද සැබෑ දේශප්‍රේමීත්වය ද විදහා පෑ එම අරගල එදවස රට ගෙන ගිය ධනපති පාලකයින්ගේ හිස් මතට හෙණ පහරක් විය. ඉතාම පසුගාමී ධනේශ්වර රාජ්‍යයක් ලෙස අපේ රට තුළ ජාතිකත්වයන් කිහිපයක් ද ආගම් හා ඇදහිලි රාශියක් ද කුල භේද ද සහිතව වසර 200කට ආසන්න කාලයක් මුළුල්ලේ රට වැසියන් බෙදී වෙන්ව ඇත. එයින් නෙළූ අස්වැන්න විටෙක ලේ විලක්ව ද තවත් විටෙක විපත් සෝ සුසුම් ගංගාවක් ලෙසද ඉතිහාසය තුළ සටහන්ව ඇත. එසේම නූපන් පරපුර පවා ලෝකයටම ණයකාරයින් බවට පත් කොට ඇත. ලාංකීය වමේ ව්‍යාපාරය ඉතිහාසයේ නොවූ විරූ සංධිස්ථානයක අභිමුවට එළැඹීම තුළ ඉතා සුවිශේෂී කාර්යභාරයක වගකීම මේ දෙරණ මත දිස්වෙමින් පවතී.

වාමාංශික දේශපාලනයේ සටන් පෙරමුණත් ඒ හා සමගාමීව පුළුල් බහුජන ව්‍යාපාරයත්, සංවිධාන යාන්ත්‍රණයත් පිළිබඳව මෙන්ම විප්ලවවාදී පක්ෂය තම ගමන් මගෙහි අභියෝග හඳුනාගැනීමටත් අවධානය යොමුකිරීම අත්‍යවශ්‍යමය. නිර්ධන පංතිය වෙත රාජ්‍ය බලය ලබාගැනීම සඳහා කරන ලද ලොව සෑම අරගලයකම සටන් පෙරමුණ බහුජන ව්‍යාපාරය හා සංවිධාන යාන්ත්‍රණය යම් ප්‍රතිශතාත්මක වෙනස්කම් සහිතව වුවද අමතක කළ නොහැකි දායකත්වය දැක්වීය.

වරෙක අපගේ ගුරුවර වූ ලෙනින් මෙසේ පවසා ඇත.

“...පක්ෂ සංවිධානය වෘත්තිය විප්ලවවාදීන්ගෙන් පමණක් සමන්විත විය යුතුයැයි කිසිවෙකුත් සිතිය යුතු නැත. ඉතා පුළුල්, නිදහස් හා ලිහිල් සංවිධාන දක්වා වූ සියලු සංවිධාන අපට අවශ්‍ය වන්නේය. මෙය ඉතා පැහැදිලි ස්වයං සාක්ෂාත් සත්‍යයක් වන බැවින් ඒ ගැන විස්තර කිරීමට අවශ්‍යතාවයක් ඇතැයි මම සිතුවෙමි.

ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයෙන් ඈත් වී නොසිටින ලෙස, එය නොසලකා නොහරින ලෙස හා විප්ලවයේ නායකත්වය ගැනීමට ධනපති පංතියට ඉඩ නොදෙන ලෙස පමණක් නොව විප්ලවයට ඉතා උද්යෝගීව හවුල් වෙමින් අඩපණ නිර්ධන පංතිය ප්‍රජාතන්ත්‍රවාදය සඳහාත්, විප්ලවය එහි අවසානය දක්වා ගෙනයාම සඳහාත් දැඩි අධිෂ්ඨානයෙන් සටන් කරන්න...”

ඉහතින් උපුටා දැක්වූ ලෙස පාර්ලිමේන්තුව, වෘත්තීය සමිති මෙන්ම ධනේෂ්වර රාජ්‍ය විසින් පවත්වාගෙන යනු ලබන ආයතන සංවිධානාත්මකව මෙහෙයවීම විප්ලවවාදී පක්ෂයේ කාර්ය කොටසකි. සමාජ, ආර්ථික, දේශපාලන පරිවර්තනයක් අරමුණු කරගත් ව්‍යාපාරය පාර්ලිමේන්තුව, පළාත් සභා හා පළාත් පාලන ආයතන නියෝජනය කරනවා සේම වෘත්තීය සමිති සංගම් ද අධ්‍යාපන, සෞඛ්‍ය, ස්වභාවික සම්පත් හා මහජන දේපළ සුරැකීම සඳහා ගොඩනැගෙන බහුජන ව්‍යාපාර සංවිධාන සඳහා ද ගොඩනැගෙන බහුජන ව්‍යාපාර සංවිධාන සඳහා ද නායකත්වය ගෙන කටයුතු කළ යුතුය. ඒ හා සමගාමීව පක්ෂ සම්මේලනය, මධ්‍යම කමිටුව, දේශපාලන මණ්ඩලය, දිස්ත්‍රික් කමිටු, ආසන කමිටු මෙන්ම ප්‍රාදේශීය කමිටු හා කොට්ඨාස කමිටු ද පාක්ෂික බහු සංවිධාන ලෙසද සංවිධාන යාන්ත්‍රණය අනුලෝම හා ප්‍රතිලෝම සන්නිවේදන ක්‍රියාවලියක් ඔස්සේ ප්‍රජාතන්ත්‍රවාදී මධ්‍යගත ව්‍යූහයක පවත්වාගෙන යා යුතුය. වෘත්තීය සමිතිවාදයටත්, පාර්ලිමේන්තුවාදයටත් එරෙහි වෘත්තීය අරගලයක් හා පාර්ලිමේන්තු අරගලයක් කරමින් විකල්ප විප්ලවවාදී ව්‍යාපාරය ලෙස අනාගත සමාජවාදී රාජ්‍යයක් වෙනුවෙන් අරගල කරන පංති ව්‍යාපාරය බවට පත් විය යුතුය. එය සිදුවන්නේ සංවිධානාත්මක බල හුවමාරුවකින්මය. එහෙයින් එවැනි මඟක යමින් ඉහළ සංවිධාන හැකියාවක් මෙන්ම සංවිධාන විනයක්ද ධෛර්යය හා ශක්තියද එක්තැන් කොට ගනිමින් ලාංකීය දේශපාලනයේ නොමැකෙන සලකුණු තැබීමට ජවිපෙ අප සමත් වී ඇත්තෙමු. එසේම එහි තරුණ ව්‍යාපාරය ලෙස සමාජවාදී තරුණ සංගමයේ අප මුළු රටේම තරුණ ප්‍රජාව නියෝජනය කරන සටන්කාමී බලවේගයයි. ජාත්‍යන්තර සංවිධාන හා ලෝකයේ කොමියුනිස්ට් ව්‍යාපාර සමඟ අත්වැල් බැඳගත් පුළුල් තරුණ ව්‍යාපාරයයි.

ජවිපෙ ලෙස අප වත්මන් ප්‍රජාතන්ත්‍රීය දේශපාලන ප්‍රවාහය තුළ හිඳිමින් මහජන නියෝජිත ආයතනයන්හි ඉහළ නියෝජනයක් ලබාගනිමින් ලාංකීය ජනතාවගේ විශ්වාසය දිනාගෙන ඇත. එසේම එකී බහුජන නියෝජිතවරුන් යනු පක්‍ෂය හා පොදු ජනතාව යා කෙරෙන ශක්තිමත් පාලමක්ද වන්නේය.

මෙහිදී මන්ත්‍රීධූර ලැබූවන් හා අපේක්ෂකයින් ලෙස ඉදිරිපත් වූවන්ගේ කාර්යභාරය කුමක් දැයි අවබෝධ කරගත යුතුය. විප්ලවවාදී පක්‍ෂයක සෑම මහජන නියෝජිත ආයතනයක් තුළම නියෝජිතයින්ගේ බහුතරය ලබා රාජ්‍ය බලය ලබාගත හැකියැයි අන්ධ විශ්වාසයකින් මාක්ස්-ලෙනින්වාදීන් නොසිටී. මන්ත්‍රී ධූර යනු දේශපාලන අරගලයේ උපකරණ වේ. සියලු බහුජන නියෝජිතයින්ගේ කාර්යභාරය වන්නේ පංති බලවේග සංවිධානය කිරීම වෙනුවෙන් පක්ෂය හා ජනතාව ගොඩනගා දුන් පෞරුෂය හා වටිනාකම් ආධාරක ලෙස භාවිතා කිරීමයි. එසේම තරුණ නායකත්වය වෙත ද අද වන විට වඩාත් බැරෑරුම් හා වගකීම්සහගතව කටයුතු කිරීමේ අවශ්‍යතාව පැනනැගී ඇත. ඒ එක් අතෙකින් රටේ තාරුණ්‍යයේ සුවිසල් කොටසක් ජාතිවාදී ගොහොරුවේ ගිල්වා තවත් ලේ වැගිරීමකට ගොදුරු කිරීමට අමන පාලකයින් විසින් මාන බලමින් සිටි හෙයිනි.

ධනපති පංතියත්, ධනපති පාලකයිනුත් ජාතිවාදය අවුළුවා අප පංතිය අසමගි කිරීමට එරෙහිව, පංතිය සමගි කිරීමත්, සංවිධානය කිරීමත් වෙනුවෙන් වන ක්‍රියාවලියේ ප්‍රමුඛම කාර්යභාරයක් තරුණ බහුජන නායකත්වයට පැවරේ. මෙහිදී පළාත් පාලන ආයතනයන් හි මන්ත්‍රීවරයෙකු ලෙස සභාව නියෝජනය කරන සහෝදර සහෝදරියන් වෙත පැවැරුණු කාර්ය කොටස වඩාත් සුවිශේෂීය. එනම් බිම්මට්ටමේ මිනිසුන් හා වඩාත් සමීපතම නියෝජිතයින් වන්නේ ඔවුන්ය. ඒ හැරුණුකොට කොට්ඨාස සඳහා ඉදිරිපත් වූ අපේක්ෂක අපේක්ෂිකාවන් සියලුදෙනාට පක්‍ෂය හා පොදු ජනතතාව යා කිරීමේ ඊට නොදෙවෙනි වූ වගකීමක් පැවරී ඇත්තේය. ප්‍රාදේශීය වශයෙන් පවත්නා ප්‍රශ්න හඳුනාගෙන ජනතාව වෙත සමීපව ඔවුන්ට නායකත්වය ලබා දෙමින් ප්‍රජාව හා බලවේග සංවිධානය කිරීමට අවැසිය. මන්ද පන්ති සටන් හා ජනතා අරගලයන් හි සැබෑ හිමිකරුවන් වන්නේ ද අපමය.

එම නිසා 2020 රාජ්‍ය බලය ලැබීමට සමත් පක්ෂය ගොඩනැගීමට සංවිධාන ජාලය මෙන්ම බහුජන ක්‍රියාකාරීත්වයද අතිශය වැදගත්ය. ගොවි සටන්, ශිෂ්‍ය සටන්, කම්කරු සටන්, තරුණ සටන් හා වෘත්තීය සටන් මෙන්ම ජනතාව තුළින් මතුවන සෑම අරගලයකටම නායකත්වය දීම වෙනුවෙන් සුළු පටු නොවන වගකීමක් අප සියලු දෙනා වෙතම පැවරේ. මහජන නියෝජිතයා සහ ගමේ නායකයා යනු හුදු තනි පුද්ගලයෙකු නොව දේශපාලන ක්‍රියාවලියක මෙහෙයුම්කරුවෙකි. එයින් උද්දාමයට පත් නොවී, එය ආභරණයක් සේ නොසලකා, පුද්ගලික ලාභ සත්කාර පසෙකලා, සමස්ත සමාජය වෙනුවෙන් කැප වූ උදාර මෙහෙවරක් ඉටු කිරීම වෙනුවෙන් නොපිරිහෙලා වගකීම් දරන්නෙකු වීම පංති ව්‍යාපාරයේ අරමුණු සාක්ෂාත් කිරීම උදෙසා අත්‍යවශ්‍ය හා වැදගත් කාර්ය කොටසක් ඉටුකරනු ඇත.

ශ්‍රී ලංකාවේ දේශපාලනය ධනපති පංතියේ මැති ඇමති දූ පුතුන්ගේ අත දෝලනය වන අවධියක 2018 පෙබරවාරි 10 වන දින පැවති පළාත් පාලන මැතිවරණය සඳහා ජවිපෙ නියෝජනය කරමින් සමාජවාදී තරුණ සංගමයේ සාමාජික සහෝදර සහෝදරියන් විශාල ප්‍රමාණයක් ඉදිරිපත් වීම විශේෂ කරුණකි.

එහිදී ලබාගත් මන්ත්‍රී ධූරවලින් සැලකිය යුතු ප්‍රමාණයක් සඳහා තරුණ සංගමයේ සාමාජිකයින් පත්කිරීම නවමු මෙන්ම වටිනා අත්දැකීමකි. ඉදින් මෙවර පළාත් පාලන ආයතන සඳහා තේරී පත්වූ තරුණ මන්ත්‍රීවරුන්ගේ කාර්යභාරය හා සමාජවාදී තරුණ සංගමයේ මන්ත්‍රීවරයෙකු අනෙකාගෙන් වෙනස් වන්නේ කෙසේද යන්න පිළිබඳව ඔවුන් දැක්වූ අදහස් කිහිපයක් මෙසේ සටහන් කරමු....

## තරුණ ප්‍රජාව මුහුණ දෙන ගැටලු වෙනුවෙන් නැගී සිටිනවා



**සමාජවාදී තරුණ සංගමයේ ජාතික කමිටු සාමාජික, පරිසර ලේකම් අසිත නිරෝෂණ සහෝදරයා**

### කඩුවෙල මහනගර සභාව

"ලංකාවේ දේශපාලනය පැරණි පරම්පරාවන්ගෙන් පිරී තිබුණු කාලයක තරුණයෙකු ලෙස මහජන නියෝජිතයෙකු බවට පත්ව කටයුතු කිරීමට අවස්ථාව සැලසුනේ ජනතා විමුක්ති පෙරමුණ නිසායි. සාමාන්‍ය පන්තියේ තරුණයා දේශපාලනයෙන් ඉවත් කර දැමීමට පාලකයින් කටයුතු කරන විට ඊට ප්‍රතිපක්ෂව තරුණයන්ට දේශපාලනයට පිවිසීමට, ජනතාවගේ නායකයෙක් බවට පත්වීමට හොඳ අවස්ථාවක් ජවිපෙ සමාජවාදී තරුණ සංගමය තුළින් ලබා දී තිබෙනවා. දැනට පවතින පළාත් පාලන ආයතන තුළින් පොදුවේ සමාජයටත්, විශේෂයෙන් තරුණ ප්‍රජාවටත් අදාළව ඔවුන් මුහුණ දෙන ගැටලු වෙනුවෙන් සාධාරණ විසඳුමක් ලබාදීමට අපොහොසත් වී තිබෙනවා. 2006 සිට අවු 12කට ආසන්න කාලයක් තුළ පළාත් පාලන ආයතන තුළින් ඉටුවිය යුතු බොහෝ සේවාවන් අහිමි වූ ජනයා වෙනුවෙන් සාධාරණයක් ඉටු කිරීමට ගෙවුණු කාලය තුළ සමාජවාදී තරුණ සංගමය හරහා අපට හැකිවුණා. විශේෂයෙන් පරිසර ප්‍රශ්න, කැලිකසළ බැහැර කිරීමේ ගැටලු, වංචා හා දූෂණ, තරුණ ප්‍රජාවට අදාළව ක්‍රීඩා පිටි, ප්‍රජා මධ්‍යස්ථාන, කියවීම් ශාලා, පුස්තකාල ඒ අතර ප්‍රධාන තැනක් ගන්නවා. ජවිපෙ තරුණ මහජන නියෝජිතයෙක් ලෙස ඉදිරි කටයුතුවල නියැලෙමින් මෙතෙක් ලබාගත් අත්දැකීම් භාවිතා කරමින් ජනතාව මුහුණ දෙන පොදු පීඩනයට එරෙහිව කටයුතු කිරීමෙන්, ජීවත් විය හැකි සාධාරණ සමාජයක් වෙනුවෙන් ඔවුන් සංවිධානය කිරීමටත් ඉදිරියේදී බලාපොරොත්තු වෙනවා. එලෙසම ආසන මට්ටමින් හා දිස්ත්‍රික් මට්ටමින් ගොඩනගා තිබෙන සමාජවාදී තරුණ සංගමයේ තරුණ බලමණ්ඩල මඟින් පොදු තරුණයා රැඩිකල් දේශපාලන ක්‍රියාකාරීත්වයකට රැගෙන ඒමට සහ ඒ වෙනුවෙන් මැදිහත් වීමටත් ඉදිරියේදී බලාපොරොත්තු වෙනවා."

## සමාජයට වැඩදායී තරුණ පරපුරක් බිහිකිරීමේ වගකීම ගන්නවා



**සමාජවාදී තරුණ සංගමයේ මහනුවර දිස්ත්‍රික් බලමණ්ඩලයේ සභාපති හිරන්ත දිල්ෂාන් සහෝදරයා**

### පූජාපිටිය ප්‍රාදේශීය සභාව

"මෙවර පළාත් පාලන මැතිවරණයෙන් ජනතා විමුක්ති පෙරමුණ පිළිබඳවත් සමාජවාදී තරුණ සංගමය පිළිබඳවත් විශ්වාසය තබා පූජාපිටිය ප්‍රාදේශීය සභාව තුළ ලබාදුන් මන්ත්‍රීධූරය භාවිතා කරමින් විශේෂ වැඩකොටසක් සිදුකිරීමට මා බලාපොරොත්තු වෙනවා. එහිදී තරුණ මන්ත්‍රීවරයෙකු ලෙස අප ප්‍රාදේශීය සභාව තුළ තරුණ තරුණියන්ගේ අයිතිවාසිකම් දිනාදෙමින් ප්‍රාදේශීය සභාව තුළින් ඔවුන් හට ඉටුවිය යුතු කාර්යභාරයන් ඉටුකිරීම සඳහා වූ මැදිහත් වීම සිදුකිරීමට ද බලාපොරොත්තු වෙනවා. ඒ අතරම සමාජවාදී තරුණ සංගමයට නව තරුණ තරුණියන් එකතු කරගනිමින් ඒ හරහා ජාතික, දිස්ත්‍රික් හා ආසන මටට්මින් විවිධ ක්ෂේත්‍රයන් ඔස්සේ අප විසින් සිදුකරනු ලබන විෂමත් විරෝධී, පාරිසරික, ක්‍රීඩා, අධ්‍යාපනික වැනි විවිධ වැඩසටහන්වලට තාරුණ්‍යය සම්බන්ධ කරගනිමින් සමාජයට වැඩදායී තරුණ පරපුරක් බිහිකිරීමේ වගකීම ඉටුකිරීමට දායක වීමටත් බලාපොරොත්තු වෙනවා."

## රඹෑව ප්‍රාදේශීය සභාව තුළ වංචාවට දූෂණයට එරෙහිව සටන් කරනවා



**සමාජවාදී තරුණ සංගමයේ මැදවච්චිය ආසන බලමණ්ඩලයේ සභාපති අනුරාධපුර දිස්ත්‍රික් බලමණ්ඩලයේ විෂමත් විරෝධී ලේකම් දිනේෂ් කුමාර කරුණාරත්න සහෝදරයා**

### රඹෑව ප්‍රාදේශීය සභාව

"වසර 70ක් තිස්සේ බොරු පොරොන්දු දෙමින් ජනතාව රවටමින් අපේ රට අගාධයකට ඇද දමා තිබෙන ධනපති දේශපාලකයෝ දිනෙන් දිනම ඉන්නේ වංචාවෙන් හා දූෂණයෙන් ඔවුන්ගේ පෞද්ගලික අරමුණු ඉටුකරගැනීමේ බල පොරයකයි. එවන් අවධියක මෙවර 2018 පළාත් පාලන මැතිවරණයෙන් රඹෑව ප්‍රාදේශීය සභාවට මන්ත්‍රීවරයෙකු ලෙස තේරී පත් වී සිටින මා රඹෑව ප්‍රාදේශීය බලප්‍රදේශයේ ජීවත් වන ජනතාවගේ අවශ්‍යතාවයන් හොඳින් හඳුනාගෙන ඔවුන්ගේ ජන ජීවිතය සුරක්ෂිත කිරීමට මාගේ උපරිම මැදිහත් වීම ලබාදීමට බලාපොරොත්තු වෙනවා. ඒ අනුව ප්‍රදේශයේ පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන, මාර්ග, ක්‍රීඩා භූමි, ස්ථාපිත කිරීමට සහ ඒවා නිසි අයුරින් නඩත්තු කිරීමටත් බලාපොරෙත්තු වෙනවා. එසේම ජනතා මුදල් සෑම රුපියලක්ම ජනතා සේවය වෙනුවෙන් යොදවමින් රඹෑව ප්‍රාදේශීය සභාව තුළ වංචාවට දූෂණයට, එරෙහිව සටන් කරමින් පොදුජනයා වෙනුවෙන් සහ විශේෂයෙන් තරුණ තරුණියන් වෙනුවෙන් පෙනීසිටීමටත් බලාපොරොත්තු වෙනවා."

## ප්‍රදේශයේ සියලු ජන කොටස් අතර සහෝදරත්වය, සමගිය, විශ්වාසය ගොඩනැගීමට මැදිහත් වෙනවා



**සමාජවාදී තරුණ සංගමයේ මාතලේ දිස්ත්‍රික් බලමණ්ඩලයේ සභාපති චමින්ද කුමාර කෝනාර සහෝදරයා**

### මාතලේ ප්‍රාදේශීය සභාව

"මාතලේ නගරයට ආසන්නම ප්‍රාදේශීය සභාව වන මාතලේ ප්‍රාදේශීය සභාව ඉතිහාසයේ මෙතෙක් අප දුටු අත්දැකීම් සහ අත්විඳීම් තුළ, දූෂණයෙන් පිරුණු ආයතනයක් බව කිව යුතුයි. එසේම එය අල්ලසට යටවුණු මන්ත්‍රීවරුන්, නිලධාරීන් සහ සභාපතිවරුන්ගෙන් පාලනය වුණු ප්‍රාදේශීය සභාවක්. පැවති පළාත් පාලන මැතිවරණයේදී ජනතා විමුක්ති පෙරමුණ පිළිබඳව විශ්වාසය තබා අපට ඡන්දය ලබාදුන් ජනතාවගේ විශ්වාසය හා බලාපොරොත්තු රැකගනිමින්, අපට ඡන්දය දුන් නොදුන් සියලු ජනතාවගේ ගැටලුවලට පක්ෂ පාට භේදයකින් තොරව සාධාරණව මැදිහත් වීමටත්, ප්‍රදේශයේ සිටින සියලු ජනකොටස් අතර සහෝදරත්වය, සමගිය හා විශ්වාසය ගොඩනැගීම වෙනුවෙන් මැදිහත් වීමටත්, ඒ වගේම ක්‍රීඩාව, කලාව හා පරිසරය ආදිය පිළිබඳව ප්‍රදේශයේ ප්‍රවීණයන් සම්බන්ධ කරගනිමින් ජනතාව දැනුවත් කිරීමටත් නිරෝගිමත්, පටු ආකල්පවලින් තොර, මනුෂ්‍යත්වයෙන් පිරිපුන්, රසවින්දනාත්මක පිරිසක් බිහිකිරීමටත් මැදිහත් වීමට බලාපොරොත්තු වෙනවා."

## තාරුණ්‍යයේ අයිතිවාසිකම් වෙනුවෙන් අඛණ්ඩ මැදිහත් වෙනවා



**සමාජවාදී තරුණ සංගමයේ පුත්තලම දිස්ත්‍රික් බලමණ්ඩලයේ සභාපති තරංග කරුණාරත්න සහෝදරයා**

### වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව

"ඇත්තටම වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව කියන්නේ දිස්ත්‍රික්කයේ අනෙකුත් පළාත් පාලන ආයතන සමඟ සංසන්දනාත්මකව බලන කල ඉතාමත් හොඳ ආදායමක් ඇති ප්‍රාදේශීය සභාවක්. වාර්ෂික ආදායම කෝටි 28ක් ඉක්මවූවත් එය අපට දැනට පෙනෙන්ට ඇත්තේ ජනතාවට සතුරු වුණු, ජනතාවගේ අභිලාෂයන් ඉෂ්ඨ කිරීමට අසමත් ආයතනයක් ලෙසයි. මෙම ආයතනය තුළ ජවිපෙ තරුණ මන්ත්‍රීවරයෙකු ලෙස මා වෙත පැවරී ඇති කාර්යභාරය සුවිශාලයි. ඒ අනුව ප්‍රදේශය තුළ ජීවත් වන ජනතාවගේ ගැටලුවලට මැදිහත් වෙමින් තරුණ තරුණියන්ගේ අයිතීන් දිනාදීම වෙනුවෙන් සභාව තුළ අඛණ්ඩව මැදිහත් වීමට බලාපොරොත්තු වෙනවා."




## ජාතිවාදයට එරෙහිව සියලු බලවේග පෙළගැසේ



පසුගිය කාලය තුළ මහනුවර දිස්ත්‍රික්කයේ තුළ ඇති වුණු ජාතිවාදී සිදුවීම්වලට එරෙහිව සමාජවාදී තරුණ සංගමය විසින් සංවිධානය කළ මාධ්‍ය හමුවක් මාර්තු 07 වැනි දින කොළඹ CSR ශාලාවේදී පැවැත්විණි. මේ සඳහා සමාජවාදී තරුණ සංගමය ඇතුළු විවිධ සංවිධාන නියෝජනය කරමින් විශ්වවිද්‍යාල ආචාර්යවරුන්, නිතීඥවරුන්, කලාකරුවන්, විද්වතුන් හා මාධ්‍යවේදීන් ඇතුළු පිරිසක් සම්බන්ධ වූහ.

මෙහි දී සමාජවාදී තරුණ සංගමයේ ජාතික සංවිධායක එරංග ගුණසේකර සහෝදරයා, කැළණිය විශ්වවිද්‍යාලයේ සමාජීය විද්‍යා පීඨයේ පීඨාධිපති, මහාචාර්ය චන්දන අබේරත්න මහතා, ප්‍රවීණ රංගන ශිල්පී චන්ද්‍රසෝම බිංදුහේවා මහතා ප්‍රවීණ රංගන ශිල්පිනී දීපානි සිල්වා මෙනවිය, ප්‍රවීණ නාට්‍යවේදී ලලිත් රාජපක්ෂ මහතා අන්තර් සමාගම් සේවක සංගමයේ ප්‍රධාන ලේකම් නීතීඥ ජානක අධිකාරී සහෝදරයා උපාධිධාරී ජාතික මධ්‍යස්ථානයේ කැඳවුම්කරු චන්දන සූරියආරච්චි සහෝදරයා ඇතුළු පිරිසක් අදහස් දැක්වූහ.

## ජල දිනය වෙනුවෙන් පැළ සිටුවීමේ ව්‍යාපෘතියක්



සමාජවාදී තරුණ සංගමයේ මහනුවර දිස්ත්‍රික් කමිටුව මඟින් සංවිධානය කරන ලද පැළ සිටුවීමේ වැඩසටහනක් පසුගිය මාර්තු 22 දින පැවැත්වීය. ලෝක ජල දිනය වෙනුවෙන් සංවිධානය කළ මෙම වැඩසටහන මහනුවර හේවාහැට ප්‍රදේශයේ දී පැවැත්විණි. මේ සඳහා තලාතුඔය, හේවාහැට මධ්‍ය මහා විද්‍යාලය, දෙල්තොට මුස්ලිම් විද්‍යාලය, අන්කෙළිපිටිය හපුතලේ මධ්‍ය විද්‍යාලය, කරගස්කඩ මධ්‍ය විද්‍යාලය හා ගලහා ශ්‍රී රාමක්‍රිෂ්ණා විද්‍යාලය නියෝජනය කරමින් එම පාසල්වල විදුහල්පතිවරුන්, ආචාර්යවරුන්, ශිෂ්‍යයින් හා මහනුවර දිස්ත්‍රික්කයේ සමාජවාදී තරුණ සංගමයේ සංවිධායක හිරන්ත ඩිල්ෂාන් සහෝදරයා ඇතුළු සමාජික සාමාජිකාවන්යන් සහභාගී වූහ.

## සමාජ මාධ්‍ය ජාලා තහනමට එරෙහිව




තවදුරටත් සමාජ මාධ්‍ය ජාලා අවහිර කළහොත් ඊට එරෙහිව දැඩි ක්‍රියාමාර්ග ගන්නා බව සමාජවාදී තරුණ සංගමයේ ජාතික සංවිධායක එරංග ගුණසේකර සහෝදරයා පැවසීය. ඒ පසුගිය මාර්තු 14 දින පැවති මාධ්‍ය හමුවක් අතරතුරදීය. එහිදී වැඩි දුරටත් අදහස් දක්වමින් ඔහු පැවසුයේ ජාතිවාදය පැනනැගීම නතර කිරීමට ආණ්ඩුවට කිසිඳු අවශ්‍යතාවයක්වත් නොතිබූ බවත් එම ගැටලුව පාදක කරගනිමින් තරුණ තරුණියන්ගේ අදහස් ප්‍රකාශ කිරීමේ අයිතියට අතැබීමට ආණ්ඩුවට සාදාචාරාත්මක අයිතියක් නොමැති බවත්ය. එසේම මේ උත්සාහය ආණ්ඩුව තමන්ගේ ආර්ථික හා දේශපාලන නොහැකියාව වසා ගැනීමට දැරූ තැතක් බවද හෙතෙම සඳහන් කළේය.

බත්තරමුල්ල, පැලවත්ත, පන්නිපිටිය පාර, 464/20, ස්ථානයේ පදිංචි බී. පුෂ්ප කුමාර වන මා විසින් අංක 52/3, අතුරුගිරිය පාර, හෝමාගම පිහිටි ක්‍රියේටිව් ස්ටැම්ප් ඇන්ඩ් ප්‍රින්ටින් ආයතනයේ මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.